157571

ජාතික ලේඛනාරක්ෂක
දෙපාර්තමේන්තුව.
-12-15

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත

---

[සහතිකය සටහන් කළේ 1978 නොවැම්බර් මස 2 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1978 නොවැම්බර් මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක

# 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත

[සහතිකය සටහන් කළේ 1978 නොවැම්බර් මස 2 වන දින]

එල්. ඩී.—ඕ. 26/78.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105(1) වන ව්‍යවස්ථාව අනුව මුල් අවස්ථා අධිකරණ පද්ධතියක් පිහිටුවීම හා සංස්ථාපනය කිරීම සඳහා ද ඒ අධිකරණවල අධිකරණ බලය නිශ්චය කොට දැක්වීම සහ ඒ අධිකරණවල සහ ඒ අධිකරණ ඉදිරියේ කාර්ය පටිපාටිය විධිමත් කිරීම සඳහා ද ඇතැම් ලිඛිත නීති ඉවත් කිරීම සඳහා ද ඉහත කී කාරණාවලට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක දී නැතහොත් දිනවල දී, මේ පනත, එහි සියලුම පරිච්ඡේද හෝ විධිවිධාන සම්බන්ධයෙන් හෝ ඒ පරිච්ඡේද හෝ විධිවිධාන අතුරින් යම් පරිච්ඡේදයක් හෝ විධිවිධානයක් සම්බන්ධයෙන් හෝ ක්‍රියාත්මක වන්නේ ය. — ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

## I වන පරිච්ඡේදය

## අධිකරණ සහ ඒවායේ ප්‍රාදේශීය බල සීමා

2. ශ්‍රී ලංකා ජනරජයේ යුක්තිය පසිඳලීම සඳහා මුල් අවස්ථා අධිකරණ, පහත දැක්වෙන අධිකරණ විය යුතුය :— — මුල් අවස්ථා අධිකරණ.

(අ) ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණය ;

(ආ) දිසා අධිකරණ ;

(ඇ) පවුල් අධිකරණ ;

(ඈ) මහෙස්ත්‍රාත් අධිකරණ ;

(ඉ) ප්‍රාථමික අධිකරණ.

3. යුක්තිය පසිඳලීමේ කාර්යය සඳහා, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් කලින් කල අග්‍ර විනිශ්චය කාරවරයා සහ අභියාචනාධිකරණයේ සභාපතිවරයා විමසා තීරණය කරනු ලබන පරිදි වූ ප්‍රාදේශීය බල සීමා ඇතුළත අධිකරණ කලාප වලට, අධිකරණ දිසාවලට සහ අධිකරණ කොට්ඨාසවලට ශ්‍රී ලංකාව බෙදනු ලැබිය යුතු ය : — ශ්‍රී ලංකාව අධිකරණ කාර්ය සඳහා බෙදීම.

එසේ වුව ද මේ වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක කරනු ලබන දිනයට පෙර දිනයේ පැවති පරිදි වූ අධිකරණ කලාප, අධිකරණ දිසා සහ අධිකරණ කොට්ඨාස සහ ඒවාට අදාළ ප්‍රාදේශීය බල සීමා අමාත්‍යවරයාගේ එම නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තෙක්, මේ පනත යටතේ වූ කලාප, දිසා සහ කොට්ඨාස ද පිළිවෙලින් ඒවායේ ප්‍රාදේශීය බල සීමා ද වශයෙන් එලෙස ම පැවතිය යුතු ය.

## II වන පරිච්ඡේදය

## මුල් අවස්ථා අධිකරණ පිහිටුවීම

*මහාධිකරණයේ සංයුතිය.*

4. ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණය, ලේඛනෝපගත කිරීමේ අධිකරණයක් විය යුතු අතර එය දස දෙනකුට නොඅඩු වූ ද දහසය දෙනකුට නොවැඩි වූ ද විනිශ්චයකාරවරයන් ගණනකින් සමන්විත විය යුතු ය. ඒ එක් එක් විනිශ්චයකාරවරයකු "මහාධිකරණ විනිශ්චයකාරවරයා" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු ය.

*දිසා අධිකරණ, පවුල් අධිකරණ, මහෙස්ත්‍රාත් අධිකරණ සහ ප්‍රාථමික අධිකරණ.*

5. (1) ශ්‍රී ලංකාවේ එක් එක් අධිකරණ දිසාවෙහි "දිසා අධිකරණයක්" සහ "පවුල් අධිකරණයක්" විය යුතු අතර, සෑම අධිකරණ කොට්ඨාසයක ම "මහෙස්ත්‍රාත් අධිකරණයක්" සහ "ප්‍රාථමික අධිකරණයක්" විය යුතු ය. ඒ එක් එක් අධිකරණය පිළිවෙළින්, "දිසා විනිශ්චයකාරවරයා", "පවුල් අධිකරණ විනිශ්චය කාරවරයා", "මහෙස්ත්‍රාත්වරයා" සහ "ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාරවරයා" යනුවෙන් හැඳින්වෙන එක් තැනැත්තකු විසින් ද ඔහු ඉදිරියේ ද පැවැත්විය යුතු ය.

(2) යම් අධිකරණ දිසාවක පවුල් අධිකරණ විනිශ්චයකාරවරයකු පත් කරනු නො ලැබූ අවස්ථාවක, ඒ අධිකරණ දිසාවේ දිසා විනිශ්චයකාරවරයා ඒ අධිකරණ දිසාවේ පවුල් අධිකරණ විනිශ්චයකාරවරයා ලෙස කටයුතු කළ යුතු අතර, ඔහු ඒ අධිකරණ දිසාවේ පවුල් අධිකරණ විනිශ්චයකාරවරයා ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය. තව ද පවුල් අධිකරණය වෙත පැවරී ඇති සියලු බලතල සහ අධිකරණ බලය ඒ විනිශ්චයකාරවරයා විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියෙහි සඳහන් එක් එක් අධිකරණය, අමාත්‍යවරයා විසින් කලින් කල නියෝග මගින් නියම කරනු ලබන, අවස්ථාවෝචිත පරිදි, ඒ අධිකරණ දිසාව හෝ කොට්ඨාසය ඇතුළත වූ පහසු ස්ථානයක හෝ ස්ථානවල පැවැත්විය හැකි ය:

එසේ වුව ද මේ වගන්තියේ කිසිවක්, ස්වකීය අධිකරණ බල ප්‍රදේශය ඇතුළත කවර හෝ පහසු ස්ථානයක අධිකරණය පැවැත්වීමට සෑම විනිශ්චයකාරවරයකුට ම ඇති බලය සීමා කරන ලෙස හෝ අඩු කරන ලෙස හෝ තේරුම් නොගත යුතු ය.

*විනිශ්චයකාරවරයන් පත් කිරීම සහ විශ්‍රාම ගැන්වීම.*

6. (1) සියලු ම දිසා විනිශ්චයකාරවරයන් ද පවුල් අධිකරණ විනිශ්චයකාරවරයන් ද මහෙස්ත්‍රාත්වරයන් ද ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාරවරයන් ද ඒ අධිකරණවල සියලු අතිරේක විනිශ්චය කාරවරයන් සහ අතිරේක මහෙස්ත්‍රාත්වරයන් ද අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ඔවුන්ගේ ධුරවලට පත් කරනු ලැබිය යුතු ය.

(2) මුල් අවස්ථා අධිකරණයක, අවස්ථාවෝචිත පරිදි, විනිශ්චය කාරවරයකු හෝ මහෙස්ත්‍රාත්වරයකු ලෙස හෝ විනිශ්චයකාරවර යකු හෝ මහෙස්ත්‍රාත්වරයකු ලෙස වැඩ බැලීමට හෝ පත් කරන ලද සෑම තැනැත්තකු ම ඔහුගේ ධුරයෙහි වැඩ භාර ගැනීමට පෙර

මෙහි පළමුවන උපලේඛනයෙහි නියමිත පරිදි ධුරයෙහි ප්‍රතිඥාව දී එයට අත්සන් තැබීම හෝ දිවුරුම දී එයට අත්සන් තැබීම හෝ කළ යුතු ය.

(3) මහාධිකරණ විනිශ්චයකාරවරයකු විශ්‍රාම ගත යුතු වයස අවුරුදු හැට එක විය යුතු ය.

(4) වෙනත් සියලුම විනිශ්චයකාරවරයන් සහ මහෙස්ත්‍රාත්වරයන් විශ්‍රාම ගත යුතු වයස රජයේ හා අධිකරණ නිලධරයන් (විශ්‍රාම ගැන්වීමේ) ආඥාපනත යටතේ සාදන ලද රීති මගින් විධිවිධාන සලසා ඇති පරිදි විය යුතු ය.

මහාධිකරණ විනිශ්චයකාරවරයන්ගේ වැටුප්.

**7.** මහාධිකරණ විනිශ්චයකාරවරයන්ගේ වැටුප් ඒකාබද්ධ අරමුදලට වැයබරක් විය යුතු ය.

අතිරේක විනිශ්චයකාරවරයන් පත් කිරීම යනාදිය.

**8.** (1) එක ම දිසා අධිකරණයට, පවුල් අධිකරණයට, මහෙස්ත්‍රාත් අධිකරණයට සහ ප්‍රාථමික අධිකරණයට පිළිවෙළින් අතිරේක දිසා විනිශ්චයකාරවරයන්, අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාරවරයන්, අතිරේක මහෙස්ත්‍රාත්වරයන් හෝ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාරවරයන් අවස්ථානුකූලව අවශ්‍ය වන සංඛ්‍යාවක් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කළ හැකි ය.

(2) එකී යම් අධිකරණයකට පත් කරනු ලැබූ සෑම අතිරේක දිසා විනිශ්චයකාරවරයකු ම, පවුල් අධිකරණ විනිශ්චයකාරවරයකු ම, මහෙස්ත්‍රාත්වරයකු ම හෝ ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාරවරයකු ම, තමා පත් කරනු ලැබ සිටින්නේ, අවස්ථාවෝචිත පරිදි, යම් දිසාවක හෝ කොට්ඨාසයක පිළිවෙළින්, යම් දිසා අධිකරණයකට, පවුල් අධිකරණයකට, මහෙස්ත්‍රාත් අධිකරණයකට හෝ ප්‍රාථමික අධිකරණයකට ද ඒ දිසා අධිකරණය, පවුල් අධිකරණය, මහෙස්ත්‍රාත් අධිකරණය හෝ ප්‍රාථමික අධිකරණය වෙත පැවරී ඇති සියලු බලතල හෝ අධිකරණ බලය වෙනා ම විනිශ්චයාසනාරූඪව ක්‍රියාත්මක කළ යුතු ය.

## III වන පරිච්ඡේදය

## ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණය

අපරාධ අධිකරණ බලය.

9. (1) මෙහි පහත දැක්වෙන වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව අධිචෝදනා මත මහාධිකරණයෙහි පවරනු ලැබූ සියලු අපරාධ නඩු ලිඛිත නීතියෙන් විධිවිධාන සලස්වා ඇති ආකාරයට විභාග කිරීමට, නඩු විභාග කිරීමට සහ තීරණය කිරීමට සාමාන්‍යයෙන් මහාධිකරණයට බලය හා අධිකාරය ඇති අතර එසේ විභාග කිරීමට, නඩු විභාග කිරීමට හා තීරණය කිරීමට එම අධිකරණයට මෙයින් නියම කරනු ලැබේ:—

(අ) ශ්‍රී ලංකාව ඇතුළත යම් වරදක් සම්පූර්ණයෙන් ම හෝ යම් වරදකින් කොටසක් හෝ සිදු කර ඇත්තේ ද එවැනි යම් වරදක් ;

(ආ) ශ්‍රී ලංකා දේශිය ජල තීරය තුළ හෝ එයට ඉහළින් යම් තැනැත්තකු විසින් සිදු කරන ලද යම් වරදක් ;

(ඇ) ශ්‍රී ලංකාවේ ගුවන් තලයෙහි යම් තැනැත්තකු විසින් සිදු කරන ලද යම් වරදක් ;

(ඈ) යම් තැනැත්තකු විසින් මහ මුහුදේ දී සිදු කරන ලද යම් වරදක් අන්තර්ජාතික නීතිය අනුව මුහුදු කොල්ලයක් ලෙස සලකනු ලබන විට, එබඳු යම් වරදක් ;

(ඉ) ශ්‍රී ලංකාවෙහි ලියාපදිංචි කරන ලද කවර වූ හෝ වර්ගයක යම් නැවක නැතහොත් යම් ගුවන් යානයක සිට හෝ එබඳු යම් නැවක් හෝ ගුවන් යානයක් සම්බන්ධයෙන් හෝ යම් තැනැත්තකු විසින් කිනම් ස්ථානයක දී වුව ද සිදු කරන ලද යම් වරදක් ; හෝ

(ඊ) කවර වූ හෝ වර්ගයක යම් නැවක නැතහොත් යම් ගුවන් යානයක සිට හෝ එබඳු යම් නැවක් හෝ ගුවන් යානයක් සම්බන්ධයෙන් හෝ ශ්‍රී ලංකාවේ දේශ සීමාවෙන් පිටත දී හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වූ යම් තැනැත්තකු විසින් කිනම් ස්ථානයක දී වුව ද සිදු කරන ලද යම් වරදක්.

(2) මහාධිකරණයෙහි අධිකරණ බලය වෙනත් යම් නීතියක විධිවිධානවලට යටත්ව—

(අ) සම්පූර්ණ වරද හෝ වරදෙහි කොටසක් හෝ ශ්‍රී ලංකාවෙහි දී සිදු කරන ලද, (1) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් යම් වරදක් සම්බන්ධයෙන් වූ විට ඒ වරද සම්පූර්ණයෙන් ම හෝ ඒ වරදෙහි කොටසක් හෝ සිදු කරනු ලැබුවේ යම් අධිකරණ කලාපයක් තුළ ද, ඒ අධිකරණ කලාපයෙහි මහාධිකරණය විසින් සාමාන්‍යයෙන් ක්‍රියාත්මක කළ යුතු ය ;

(ආ) යම් ස්ථානයක දී සිදු කරන ලද (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සිට (ඊ) ඡේදය දක්වා වූ ඡේදවල සඳහන් යම් වරදක් සම්බන්ධයෙන් වූ විට, අභියාචනාධිකරණයේ සභාපතිවරයා විසින් සිය අත්සන යටතේ වූ ලියවිල්ලක් මගින් කරනු ලබන විධානයකින් නම් කරනු ලබන අධිකරණ කලාපයෙහි මහාධිකරණය විසින් ක්‍රියාත්මක කළ යුතු ය :

එසේ වුව ද අභියාචනාධිකරණයේ සභාපතිවරයා සුදුසු යයි සලකනහොත්, ඔහු විසින් සිය අත්සන යටතේ වූ ලියවිල්ලක් මගින් විධානයක් කිරීමෙන් යම් කිසි වෙනත් අධිකරණ කලාපයක පැවැත්වෙන මහාධිකරණයක් විසින් සාමාන්‍යයෙන් විභාග කොට තීරණය කරනු ලැබිය හැකි (අ) ඡේදයෙහි සඳහන් යම් වරදක් තමා විසින් නම් කරනු ලබන යම් කලාපයක මහාධිකරණයක් විසින් විභාග කොට තීරණය කළ යුතු යයි විධාන කරනු ලැබිය හැකි ය.

දණ්ඩන නියමය.

**10.** ලිඛිත නීතියෙන් නියමිත යම් දණ්ඩන නියමයක් කිරීම හෝ එසේ නියමිත වෙනත් දඬුවමක් පැනවීම මහාධිකරණ විනිශ්චයකාරවරයන් විසින් කරනු ලැබිය හැකි ය.

ජූරි සභාවක් මගින් පවත්වනු ලබන නඩු විභාග සහ වෙනත් නඩු විභාග.

**11.** (1) පහත සඳහන් අවස්ථාවල දී මහාධිකරණයේ නඩු විභාගය මහාධිකරණ විනිශ්චයකාරවරයකු ඉදිරියේ ජූරි සභාවක් මගින් පැවැත්විය යුතු ය:—

(අ) චෝදනාවලින් යටත් පිරිසෙයින් එක් චෝදනාවක්වත් මෙහි දෙවන උපලේඛනයේ සඳහන් වැරදි පිළිබඳ ලැයිස්තුවට ඇතුළත් වන අවස්ථාවක ; හෝ

(ආ) නඩු විභාගය ජූරි සභාවක් මගින් පැවැත්විය යුතු යයි තත් කාලයෙහි නීතියට අනුකූලව නීතිපතිවරයා විසින් තීරණය කරනු ලබන වෙනත් කවර හෝ අවස්ථාවක.

(2) අනෙකුත් සියලුම නඩු විභාග ජූරි සභාවක් නැතිව තනිව ම විනිශ්චයාසනාරූඪ වන මහාධිකරණ විනිශ්චයකාරවරයකු ඉදිරියේ පැවැත්විය යුතු ය.

විශේෂ අධිකරණ විභාග.

**12.** (1) මේ පනතෙහි හෝ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් ව ඇත ද දණ්ඩ නීති සංග්‍රහය සහ වෙනත් නීති යටතේ දඬුවම් කළ යුතු වැරදි සඳහා තත් කාලයෙහි බලපවත්නා නීතියට අනුව විශේෂ අධිකරණ විභාග පැවැත්වීම මහාධිකරණය විසින් කළ යුතු ය.

(2) අග්‍ර විනිශ්චයකාරවරයා විසින් මහාධිකරණයේ විනිශ්චයකාරවරයන් තිදෙනකුගෙන් යුත් විනිශ්චය පීඨයක් පත් කර ඔවුන් ගෙන් එක් විනිශ්චයකාරවරයකු එහි සභාපතිවරයා ලෙස නම් කිරීම ද නඩු විභාගය පැවැත්විය යුතු කලාපය නිශ්චය කිරීම ද කළ යුතු ය:

එසේ වුව ද මේ උපවගන්තිය යටතේ අග්‍ර විනිශ්චයකාරවරයා විසින් කරන ලද විධානයකට විෂය වූ යම්කිසි කාරණයක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කරන ලද අභියාචනයක් විභාග කිරීමට, මේ උපවගන්තිය යටතේ ආඥාවක් කර තිබීමෙන් අග්‍ර විනිශ්චයකාරවරයා නුසුදුස්සකු නොවිය යුතු අතර ඔහු ඉන් වළක්වනු නොලැබිය යුතු ය.

අද්මිරාල්ති අධිකරණ බලය.

**13.** (1) අද්මිරාල්ති අධිකරණ බලය මහාධිකරණය වෙත මෙයින් පවරනු ලබන අතර, ඒ අධිකරණ බලය සාමාන්‍යයෙන් කොළඹ අධිකරණ කලාපයේ මහාධිකරණයෙහි විනිශ්චයාසනාරූඪ විනිශ්චයකාරවරයකු විසින් ක්‍රියාත්මක කළ යුතු ය:

එසේ වුව ද අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් වෙනත් යම් අධිකරණ කලාපයක මහාධිකරණයෙහි විනිශ්චයාසනාරූඪ විනිශ්චයකාරවරයකුට අද්මිරාල්ති අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ බලය ද පවරා එම අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා ප්‍රාදේශීය බල සීමාවන් ද ඊට යාබද යම් දේශීය ජල තීරයක් වෙයි නම් ඒ දේශීය ජල තීරය ද

(2) මහාධිකරණය වෙත පැවරී ඇති අද්මිරාල්ති අධිකරණ බලය තත් කාලයෙහි බල පවත්නා නීතියෙන් විධිවිධාන සලස්වා ඇති ආකාරයට විය යුතු ය.

(3) (අ) අද්මිරාල්ති අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමෙහි ලා දෙන ලද අවසාන නඩු තීන්දුවකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් සිද්ධියෙහි හෝ නීතියෙහි ලා වූ යම් දෝෂයක් සම්බන්ධයෙන් එම නඩු තීන්දුවට විරුද්ධව අභියාචනයක් අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කළ හැකි ය.

(ආ) අද්මිරාල්ති අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමෙහි ලා කරන ලද ආඥාවකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, අභියාචනාධිකරණයේ අවසරය කලින් ලබාගෙන, සිද්ධිය හෝ නීතිය පිළිබඳ යම් දෝෂයක් නිවැරදි කර ගැනීම සඳහා ඒ ආඥාවට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචනා කරනු ලැබිය හැකි ය.

(ඇ) අභියාචනාධිකරණය වෙත කරනු ලබන සෑම අභියාචනයක් ම සහ අභියාචනා කිරීමේ අවසරය සඳහා වූ සෑම ඉල්ලීමක් ම, හැකිතාක් දුරට සිවිල් නඩු විධාන සංග්‍රහය මගින් නියම කර ඇති කාර්ය පටිපාටියට හැකිතාක් අනුකූලව කළ යුතු ය.

අපරාධ නඩුවල දී අභියාචනය කිරීමේ අයිතිවාසිකම.

**14.** මහාධිකරණය විසින් යම් වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබ සිටින තැනැත්තකු විසින්—

(අ) ජූරි සභාවක් ඇතිව නඩු විභාගය කරන ලද නඩුවක් සම්බන්ධයෙන් වන විට—

(i) තමා වරදකරු කිරීමට විරුද්ධව නීතිය පිළිබඳ ප්‍රශ්නයක් පමණක් ඇතුළත් යම් හේතුවක් මත ; හෝ

(ii) තමා වරදකරු කිරීමට විරුද්ධව සිද්ධිය පිළිබඳ ප්‍රශ්නයක් පමණක් නැතහොත් නීතිය හා සිද්ධිය මිශ්‍ර ප්‍රශ්නයක් ඇතුළත් යම් හේතුවක් මත ; හෝ

(iii) තමා වරදකරු කිරීමේ දී කරන ලද දණ්ඩන නියමය නීතියෙන් නියමිත දණ්ඩන නියමය නොවේ නම්, ඒ දණ්ඩන නියමයට විරුද්ධව, අභියාචනාධිකරණයේ අවසරය ඇතිව

අභියාචනාධිකරණය වෙත අභියාචනය කළ හැකි ය.

(ආ) ජූරි සභාවක් නැතිව නඩු විභාග කරනු ලැබූ නඩුවක් සම්බන්ධයෙන් වන විට—

(i) චූදිතයා වරද පිළිගෙන ඇති අවස්ථාවක ; හෝ

. . .

(ii) දණ්ඩන නියමය කවර වූ හෝ ආකාරයකට එක් මාසයක කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් එක් සියයක් නොඉක්මවන දඩයක් හෝ වන අවස්ථාවක ; හෝ

හැර, යම්කිසි වරදකරු කිරීමකට නැතහොත් දණ්ඩන නියමයකට විරුද්ධව, අයිතිවාසිකමක් වශයෙන් අභියාචනාධිකරණය වෙත අභියාචනය කළ හැකි ය :

එසේ වුව ද එකී සෑම අවස්ථාවක දී ම නීතිය පිළිබඳ වූ ප්‍රශ්නයක් මත හෝ චූදිතයා වරද පිළිගෙන ඇති විටක, දණ්ඩන නියමය පමණක් පිළිබඳ වූ ප්‍රශ්නයක් මත හෝ, අභියාචනයක් කළ හැකි ය.

15. මෙහි පහත දැක්වෙන අවස්ථාවල දී, එනම් :— අපරාධ නඩුවල දී අභියාචනය කිරීමට නීතිපතිවරයාට ඇති අයිතිවාසිකම.

(අ) මහාධිකරණය විසින් කරන ලද නිදොස් කිරීමේ ආඥාවකට විරුද්ධව වූ අභියාචනයක් නම්—

(i) එය ජූරි සභාවක් ඇතිව හෝ නැතිව හෝ පවත්වන ලද නඩු විභාගයක් සම්බන්ධයෙන් වන විට නීතිය පිළිබඳ පමණක් වූ ප්‍රශ්නයක් මත ද,

(ii) එය ජූරි සභාවක් නැතිව පවත්වන ලද නඩු විභාගයක් සම්බන්ධයෙන් වන විට අභියාචනාධිකරණයෙන් කලින් ලබාගත් අවසරය ඇතිව, සිද්ධිය පිළිබඳ පමණක් වූ ප්‍රශ්නයක් හෝ නීතිය හා සිද්ධිය මිශ්‍ර ප්‍රශ්නයක් මත ද,

(ආ) සෑම නඩුවක දී ම, කරන ලද දණ්ඩන නියමය ප්‍රමාණවත් නොවීමේ හෝ නීත්‍යනුකූල නොවීමේ හේතුව මත හෝ මහාධිකරණයේ වෙනත් යම්කිසි ආඥාවක් නීත්‍යනුකූල නොවීමේ හේතුව මත ද

නීතිපතිවරයා විසින් අභියාචනාධිකරණය වෙත අභියාචනය කළ හැකි ය.

16. (1) අපරාධ නඩුවල දී මහාධිකරණයේ නඩු තීන්දුවකින්, ආඥාවකින් හෝ දණ්ඩන නියමයකින් අතෘප්තියට පත් නැනැත්තකුට මේ පරිච්ඡේදය යටතේ අභියාචනය කිරීමේ අයිතිවාසිකම නීතිපතිවරයාට තිබෙන සෑම අවස්ථාවක ම, අභියාචනාධිකරණයෙන් කලින් ලබාගත් අවසරය ඇතිව අභියාචනාධිකරණය වෙත අභියාචනය කළ හැකි ය. අපරාධ නඩුවල දී අතෘප්තියට පත් නැනැත්තන්ට අභියාචනය කිරීමට ඇති අයිතිවාසිකම.

(2) මේ වගන්තියෙහි "අතෘප්තියට පත් නැනැත්තකු" යන්නෙන්, කරන ලදැයි කියනු යම් වරදක් සම්බන්ධයෙන් නීතිපතිවරයා විසින් මේ පරිච්ඡේදය යටතේ අභියාචනයක් කරනු ලැබිය හැකි යම් වරදකට යම් නැනැත්තකු හෝ ඔහුගේ දේපළ විෂය වී ඇත්තේ ද ඒ නැනැත්තා අදහස් වේ. තව ද ඒ නැනැත්තා මිය ගොස් ඇත් නම් ඔහුගේ ළඟම නෑයා, එනම් ඒ නැනැත්තාගේ ජීවත්ව සිටින භාර්යාව නැතහොත් ස්වාමිපුරුෂයා, ළමයින්, දෙමව්පියන් හෝ අනෙකුත් පැවැතෙන්නන් හෝ සහෝදර සහෝදරියන් හෝ ඊට ඇතුළත් වේ.

(3) යම් උචිත අවස්ථාවක දී පරිශෝධනය කිරීම් වශයෙන් ක්‍රියා කිරීමට අභියාචනාධිකරණයට ඇති බලය කෙරෙහි මේ වගන්තියේ ඇතුළත් කිසිවක් කවර වූ හෝ ආකාරයකින් බල නොපෑ යුතු ය.

මහාධිකරණයේ නඩු විභාග.

17. මේ පනතේ 3 වන වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇත්තා වූ ද ඒ යටතේ පවතින්නා වූ ද කවර වූ හෝ අධිකරණ කලාපයක් ඇතුළත මහාධිකරණය විසින් ස්වකීය අධිකරණ බලය මේ පනතේ විධිවිධානවලට යටත්ව ක්‍රියාත්මක කළ හැකි ය. අභියාචනාධිකරණයේ සභාපතිවරයා විසින් කලින් කල ස්වකීය අත්සන යටතේ වූ ලියවිල්ලක් මගින් ඒ ලියවිල්ලේ නිශ්චය කොට දක්වා ඇති ඒ ඒ කලාපයේ පැවැත්වෙන නඩු විභාගවල දී මහාධිකරණයේ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම සඳහා මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු නම් කොට තත්කාර්ය ඒ විනිශ්චයකාරවරයාට පවරා දෙනු ලැබිය හැකි ය.

මහාධිකරණයට අපහාස කිරීම.

18. මහාධිකරණයේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි හෝ සිදු කරනු ලැබූ යම් අපහාස වරදක් සංජානනය කිරීමටත්, ලඝු ක්‍රමයට විභාග කිරීමටත්, වරදකරු කරනු ලැබූ පසු ඒ වරදකරු අවුරුදු පහක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කරන ලෙස නියම කිරීමටත්, මහාධිකරණයට බලය හා අධිකාරය තිබිය යුතු ය. ඒ බන්ධනාගාරගත කිරීම අධිකරණය විසින් විධාන කරන පරිදි බරපතල වැඩ ඇතිව හෝ නැතිව හෝ විය යුතු අතර, ඊට අතිරේකව හෝ ඒ වෙනුවට හෝ අධිකරණයේ අභිමතය පරිදි රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයක් ගෙවන ලෙස ද නියම කරනු ලැබිය හැකි ය.

## IV වන පරිච්ඡේදය

## දිසා අධිකරණ

දිසා අධිකරණවල අධිකරණ බලය.

19. සෑම දිසා අධිකරණයක් ම ලේඛනෝපගත කිරීමේ අධිකරණයක් විය යුතු අතර, සියලුම සිවිල්, ආදායම්, භාර, වස්තු භංගත්ව සහ තෙස්තමේන්තු කාරණා යන මේ කාරණා අතුරින්, මේ පනතින් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ මුල් අධිකරණ බලය වශයෙන් වෙනත් යම් අධිකරණයකට අනන්‍ය වශයෙන් පවරා දෙනු ලැබූ නැතහොත් වෙනත් යම් බලධරයකු වෙත අනන්‍ය වශයෙන් සතු කර දෙනු ලැබූ හෝ කාරණා හැර, අනෙකුත් කාරණා සම්බන්ධයෙන් අසීමිත මුල් අධිකරණ බලය ද දඬ, දණ්ඩන සහ රාජ්‍ය සන්තක කිරීම් පැනවීමෙහි ලා අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ බලය ද දිසා අධිකරණයට ස්වකීය දිසාව තුළ තිබිය යුතු ය. තව ද සිහිවිකල නැනැත්තන්, රක්ෂිත නැනැත්තන් හා ඔවුන්ගේ මුදල් සම්බන්ධයෙන් ද අර්ථලාභීන්ගේ මුදල් සම්බන්ධයෙන් ද දිසා අධිකරණ වෙත නීතිය මගින් මීට ඉහත හෝ දැනට හෝ අධිකරණ බලය පවරා ඇත්තා වූ නැතහොත් මින් මතු අධිකරණ බලය පවරනු ලබන්නා වූ වෙනත් යම් කාරණයක් සම්බන්ධයෙන් ද ඉහත කී ... දිසා අධිකරණයට තිබිය යුතු ය.

මුග්ධයන් සහ සිහිවිකල තැනැත්තන් යනාදීන්ගේ පෞද්ගලික භාරකාරත්වය සහ ඔවුන්ගේ දේපළෙහි භාරකාරත්වය.

**20.** (1) සෑම දිසා අධිකරණයක් විසින් ම, ස්වකීය අධිකරණ දිසාව ඇතුළත පදිංචි සියලු මුග්ධයන් සහ සිහිවිකල තැනැත්තන් ද මානසික හෝ කායික දුබලතා නිසා හෝ ඒ දුබලතා දෙකම නිසා අවස්ථාවෝචිත පරිදි තමා හෝ තම කටයුතු හෝ බලා ගැනීමට හෝ පාලනය කර ගැනීමට නොහැකි තැනැත්තන් ද අධිකරණයේ රක්ෂිතයන් බවට පත් කිරීමේ සහ ඒ සියලු තැනැත්තන් සහ ඔවුන්ගේ බූදල් සඳහා භාරකරුවන් සහ දේපළ ආරක්ෂකයන් පත් කිරීමේ ද, ඒ තැනැත්තන් නඩත්තු කිරීම සඳහා සහ ඔවුන්ගේ බූදල් නිසි පරිදි කළමනාකරණය කිරීම සඳහා ආඥා කිරීමේ ද, එකී භාරකරුවන්ගෙන් සහ දේපළ ආරක්ෂකයන්ගෙන් එකී කළමනාකරණය සඳහා යෝග්‍ය ඇප ගැනීමේ සහ ගිණුම් ඉදිරිපත් කරණ ලෙස ඔවුන්ට නියම කිරීමේ ද, ඉහත කී යම්කිසි තැනැත්තන්ට හෝ ඔවුන්ගේ බූදල්වලට හෝ ලැබිය යුතුව ඇති යම් ශේෂයක් වේ නම් එය ගෙවන ලෙස ඒ භාරකරුවන්ට සහ දේපළ ආරක්ෂකයන්ට නියම කිරීමේ සහ එය ගෙවීමට ඔවුන්ට බල කිරීමේ ද, එවැනි යම් ශේෂයක් සුරක්ෂිතව ආයෝජනය කිරීම සඳහා ආඥා කිරීමේ ද, අවස්ථාව අනුව අවශ්‍ය වන පරිදි කලින් කල ඒ භාරකරුවන් සහ දේපළ ආරක්ෂකයන් ඉවත් කිරීමේ සහ ඒ වෙනුවට වෙනත් තැනැත්තන් පත් කිරීමේ ද සම්පූර්ණ බලය ඇතිව, එවැනි සියලු තැනැත්තන්ගේ ආරක්ෂාව සහ භාරකාරත්වය දැරිය යුතු ය.

(2) යම් තැනැත්තකු (1) වන උපවගන්තිය යටතේ අධිකරණයේ රක්ෂිතයකු බවට පත් කරනු ලැබූ විට, ආරක්ෂාව සඳහා වූ ආඥා ඇතුලුව අධිකරණය විසින් ආඥාවකින් නියම කරනු ලැබිය හැකි නියම සහ කොන්දේසිවලට යටත්ව, අධිකරණයෙහි අවසරය ඇති ව මිස ඔහු ශ්‍රී ලංකාවෙන් පිටතට ගෙන යාම නොකළ යුතු ය. අධිකරණයේ අවසරය නොමැතිව දැන දැනම එවැනි තැනැත්තකු එසේ ගෙන යන්නා වූ හෝ ගෙන යාමෙහි ලා සහාය වන්නා වූ යම් තැනැත්තකු අධිකරණයට අපහාස කරනු ලැබුවාක් සේ දඬුවම් කරනු ලැබීමට යටත් විය යුතු ය.

(3) සිහි විකල තැනැත්තන්ගේ සහ මානසික ඌනතා ඇති තැනැත්තන්ගේ දේපළ භාරව සිටීම සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ දිසා අධිකරණවල අධිකරණ බලය හා බලතල ශ්‍රී ලංකාවෙහි වාසික නොවන සිහිවිකල තැනැත්තන්ගේ සහ මානසික ඌනතා ඇති තැනැත්තන්ගේ ශ්‍රී ලංකාවෙහි පිහිටි දේපළ භාරව සිටීම කෙරෙහි ද ව්‍යාප්ත විය යුතු අතර එවැනි යම් දේපළක් පිහිටා ඇත්තේ යම් දිසා අධිකරණයක ප්‍රාදේශීය බල සීමා තුළ ද එම දිසා අධිකරණය විසින් එම අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(4) “ මානසික ඌනතා ඇති තැනැත්තා ” යන්නෙන්, මානසික ආබාධයක් හෝ අබලතාවක් ඇත්තා වූ ද, තත්කාලයෙහි බල පවත්නා නීතියට අනුව සිහිවිකල තැනැත්තකු ලෙස විනිශ්චය කරනු නොලැබූව ද තම කටයුතු පාලනය කර ගැනීමට හැකියාවක් නොමැත්තා වූ ද තැනැත්තෙක් අදහස් වේ.

ටෙස්තමේන්තු අධිකරණ බලය

**21.** තත්කාලයෙහි බලපවත්නා නීතියට යටත්ව සහ අනුකූල ව, සෑම දිසා අධිකරණයකට ම—

(1) අන්තිම කැමති පත්‍රයක් නොතබා මිය යන තැනැත්තන් ගේ මුදලය සහ බඩුබාහිරාදිය ද තමාගේ මුදලය හෝ බඩු බාහිරාදිය පරිපාලනය කිරීමට යම්කිසි පොල්මෑකරුවකු නැතහොත් භාරකරුවකු අන්තිම කැමති පත්‍රයකින් හෝ තෙස්තමේන්තුවකින් හෝ පත් කර නොමැතිව මිය යන යම්කිසි තැනැත්තකුගේ මුදලය සහ බඩුබාහිරාදිය ද අ.න්තේ ඒ අධිකරණ දිසාව තුළ වුව ද ශ්‍රී ලංකාව ඇතු ළත වෙනත් යම්කිසි අධිකරණ දිසාවක හෝ දිසාවල හෝ වුව ද ඒ මුදල් හෝ බඩුබාහිරාදිය පාලනය කිරීම සඳහා තත්කාලයෙහි බලපවත්නා නීතියට අනුව අද්මිනිස්ත්‍රාසි කරුවන් පත් කිරීමට සම්පූර්ණ බලය හා අධිකාරය තිබිය යුතු ය;

(2) ශ්‍රී ලංකාව ඇතුළත යම් දේපළක් තබා මිය ගිය යම් තැනැත් තකුගේ අන්තිම කැමති පත්‍රය සහ තෙස්තමේන්තුව වශයෙන් හෝ ඒ සඳහා හෝ ඒ අධිකරණයට ඉදිරිපත් කරන ලද ලේඛනයක හෝ ලේඛනවල වලංගු භාවය පරීක්ෂා කිරීමට සහ ඒ පිළිබඳව තීරණය කිරීමට ද එය වාර්තාගත කිරීමට සහ ඒ වෙනුවෙන් ප්‍රොබේට් බලපත්‍රය ප්‍රදානය කිරීමට ද සම්පූර්ණ බලය හා අධිකාරය තිබිය යුතු ය;

(3) ඉහත කී පරිදි වූ යම්කිසි අන්තිම කැමති පත්‍රයකින් හෝ තෙස්තමේන්තුවකින් පත් කරන ලද පොල්මෑකරුවන් හෝ භාරකරුවන්, ඒ වෙනුවෙන් ප්‍රොබේට් බලපත්‍රය අධිකරණය ඉදිරියේ පෙනී සිට ලබාගෙන නොමැති අවස්ථාවල දී හෝ එසේ පෙනී සිට එවැනි ප්‍රොබේට් බල පත්‍රයක් ලබා ගෙන තිබුණ ද ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්වී ඇති අවස්ථාවල දී නැතහොත් මිය යාම නිසා හෝ අන් හේතුවක් නිසා හෝ එකී භාරය අංග සම් පූර්ණව ක්‍රියාවේ යෙදවීමට නොහැකිව සිටින අවස්ථාවල දී එකී අන්තිම කැමති පත්‍රයේ හෝ තෙස්තමේන්තුවේ භාරය පරිපාලනය කිරීම සඳහා හෝ ක්‍රියාවේ යෙදවීම සඳහා අද්මිනිස්ත්‍රාසිකරුවන් පත් කිරීමට සම්පූර්ණ බලය හා අධිකාරය තිබිය යුතු ය; තව ද

(4) යම් මිය ගිය තැනැත්තන්ගේ අන්තිම කැමති පත්‍රවල සහ තෙස්තමේන්තුවල හෝ අන්තිම කැමති පත්‍රයක් නොතබා මිය ගිය තැනැත්තන්ගේ දේපළවල හා බඩුබාහිරාදියේ හෝ සියලුම පොල්මෑකරුවන්ගෙන් සහ අද්මිනිස්ත්‍රාසි කරුවන්ගෙන් ද යම් මිය ගිය තැනැත්තන්ගේ අන්තිම කැමති පත්‍ර සහ තෙස්තමේන්තු අද්මිනිස්ත්‍රාසි කිරීම සඳහා ඉල්ලුම් කරන පොල්මෑකරුවන්ගේ ඇටෝර්නි බල කරුවන්ගෙන් ද එම භාර විශ්වාසවන්ත ලෙස ඉටු කිරීම සඳහා සහ එම භාර ක්‍රියාවේ යෙදවීමේ දී ඔවුන් අතට පත් වන හෝ ඔවුන් විසින් වැය කරනු ලබන සියලු දේ ගැන එම අධිකරණයට නිසි ගණන් හිලව් ඉදිරිපත් කිරීම සඳහා (ඇප තැබීමට නියම කිරීම අවස්ථාවෝචිත යයි අධිකරණ

යටි පෙනී යන තවර අවස්ථාවක වුව ද) නිසි ඇප ගැනීමට ද නිසි ගණන් හිලව් ඉදිරිපත් කරන ලෙස ඔවුන්ට නියම කිරීමට ද සම්පූර්ණ බලය හා අධිකාරය ඇත්තේ ය ; තව ද ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද සියලු ගිණුම්, අවස්ථෝචිත යයි අධිකරණය විසින් සලකනු ලබන යම් අවස්ථාවක, යථා පරිදි සහ සුපරීක්ෂාකාරීව විගණනය කර වීමට හා පරීක්ෂා කරවීමට ද එම භාර ඉටු කිරීමෙහි ලා යෙදවිය යුතුව ඔවුන් අතෙහි කලින් කල ඉතිරි වී ඇති යම් මුදල් ඔවුන්ගෙන් අය කිරීමට හා ඒවා ගෙවන ලෙස ඔවුන්ට බල කිරීමට ද එවැනි ශේෂ ආරක්ෂා සහිත ලෙස ආයෝජනය කිරීම සහ ඊට හිමිකම ඇතැයි තීරණය කරනු ලබන තැනැත්තන් අතර හා තැනැත්තන්ට ඒවා කොටස් කර දීම හා ගෙවීම සම්බන්ධයෙන් එකී අද්මිනිස්ත්‍රාසිකරුවන්ට හා පොල්මාකරුවන්ට ආඥා කිරීමට ද අවස්ථාවට අනුව අවශ්‍ය වන පරිදි කලින් කල ඒ අද්මිනිස්ත්‍රාසිකරුවන් ඉවත් කොට ඒ වෙනුවට වෙනත් තැනැත්තන් පත් කිරීමට ද ඒ අධිකරණයට සම්පූර්ණ බලය හා අධිකාරය තිබිය යුතු ය.

නෙස්තමේන්තු නඩු මාරු කිරීම.

22. යම් අධිකරණයක අධිකරණ බල සීමාව තුළ දේපළ තබා මිය ගිය යම් තැනැත්තකුගේ අන්තිම කැමති පත්‍රය පිළිබඳ ප්‍රොබේට් බලපත්‍රය හෝ ඔහුගේ බූදලය සහ බඩු බාහිරාදිය පිළිබඳ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය හෝ මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ වෙනත් යම් අධිකරණයක් විසින් නිකුත් කර ඇති අවස්ථාවක හෝ එකී ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය සඳහා වූ යම් ඉල්ලීමක් යම් අධිකරණයක් වෙත කර ඇති අවස්ථාවක, එකී ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය සම්බන්ධයෙන් එකී අධිකරණයක පවතින යම් නඩු නිමිත්තක්, සිවිල් නඩුවක්, නඩුවක් හෝ කාරණයක් වෙනත් අධිකරණයකට මාරු කිරීම සඳහා වූ ආඥාවක්, එසේ මාරු කිරීම සඳහා සෑහෙන හේතු දක්වන ඉල්ලීමක් මත, අභියාචනාධිකරණය විසින් කිරීම නීත්‍යනුකූල විය යුතු ය ; එය එසේ මාරු කරනු ලැබුවේ යම් අධිකරණයකට ද එම අධිකරණය විසින් එය සංජානනය කළ යුතු අතර, එය යම් අධිකරණයක් විසින් මුලින් සංජානනය කළ හැකිව තිබුණේ ද ඒ අධිකරණයට ඒ සම්බන්ධයෙන් තිබූ බලතල හා අධිකරණ බලය ම, සියලු අභිප්‍රායන් සහ කාර්ය සඳහා, ඒ හා සමාන ඵලදායී ලෙස, සියලු කාරණා සම්බන්ධයෙන්, ඒ නඩු නිමිත්ත, සිවිල් නඩුව, නඩුව හෝ කාරණය මාරු කරනු ලැබූ අධිකරණයට තිබිය යුතු ය.

අභියාචන.

23. අභියාචනයක් කිරීමේ අයිතිවාසිකම යම් කිසි ලිඛිත නීතියක් මගින් ප්‍රකාශිතව ම අහිමි කර ඇති අවස්ථාවක හැර, දිසා අධිකරණයක් විසින් ප්‍රකාශ කරන ලද යම් නඩු තීන්දුවකින්, තීන්දු ප්‍රකාශයකින් හෝ ආඥාවකින් අතෘප්තියට පත් යම් පාර්ශ්වකරුවකු විසින් එම අධිකරණය අතින් සිදු වූ නීතිය හෝ සිද්ධිය පිළිබඳ දෝෂයක් මත එම නඩු තීන්දුවට, තීන්දු ප්‍රකාශයට හෝ ආඥාවට විරුද්ධව අභියාචනයක්, එවැනි අභියාචන ඉදිරිපත් කිරීමේ ආකාරය හා කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් බලපවත්වන්නා වූ හෝ ඒ ආකාරය

හා කාර්ය පටිපාටිය පාලනය කෙරෙන්නා වූ යම් නීතියකට, නියෝගයකට හෝ රීතියකට අනුකූලව, අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කළ හැකි ය.

## V වන පරිච්ඡේදය

## පවුල් අධිකරණ

පවුල් අධිකරණවල අධිකරණ බලය.

24. (1) පවුල් අධිකරණය ලේඛනෝපගත කිරීමේ අධිකරණයක් විය යුතු අතර ඒ අධිකරණයට වෛවාහික ආරාවුල් සම්බන්ධයෙන් ද දික්කසාද නඩු, විවාහ ශූන්‍යතා නඩු, වෙන්වීම සඳහා වූ නඩු, අනාචාරය සඳහා වන්දි ගෙවීම පිළිබඳ නඩු සම්බන්ධයෙන් ද නඩත්තු සහ දික්කසාද දීමනා සඳහා වූ ඉල්ලීම් සම්බන්ධයෙන් ද ස්වාමිපුරුෂයා හා භාර්යාව අතර, දෙමාපියන් හා දරුවන් අතර වෛවාහික දේපළ පිළිබඳව, බාලවයස්කාර දරුවන්ගේ භාරය පිළිබඳව සහ යැපෙන්නන්ගේ හිමිකම්පෑම් පිළිබඳව ඇතිවන ආරාවුල් සම්බන්ධයෙන් ද පුද්ගල භාරකාරත්වය හෝ දේපළ භාරකාරත්වය පිළිබඳ කාරණා සම්බන්ධයෙන් ද, සුජාතභාවය සහ අවජාතභාවය ද වෛවාහිකත්වය ද පිළිබඳ තත්ව ප්‍රකාශ කරවා ගැනීමේ හිමිකම්පෑම් සම්බන්ධයෙන් ද, දරුකමට හදා ගැනීම සම්බන්ධයෙන් ද උප්පැන්න ලේඛන සටහන් සංශෝධනය කිරීම සම්බන්ධයෙන් ද දූෂණය කිරීම සහ වෛවාහික පොරොන්දු කඩ කිරීම් සඳහා හිමිකම් පෑම් සම්බන්ධයෙන් ද වෙනත් යම්කිසි නීතියකින් විධිවිධාන සලසා ඇති වෙනත් කාරණා සම්බන්ධයෙන් ද තනි මුල් අධිකරණ බලය තිබිය යුතු ය :

එසේ වුව ද මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කිසිවක් උඩරට විවාහ හා දික්කසාද පනතේ විධිවිධාන කෙරෙහි සහ මුස්ලිම් විවාහ හා දික්කසාද පනතේ විධිවිධාන කෙරෙහි බල නො පැවැත්විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් සියලු කාරණා සම්බන්ධයෙන් තනි හා අනන්‍ය අධිකරණ බලය ද පවුල් අධිකරණයට තිබිය යුතු ය. තව ද මෙහි තුන්වන උපලේඛනයෙහි සඳහන් ප්‍රඥප්ති අතුරින් කිසිවක එම කාරණා සම්බන්ධයෙන් යම් අධිකරණයක් පිළිබඳව සඳහන් කෙරෙන අවස්ථාවක එය පවුල් අධිකරණයක් සම්බන්ධයෙන් කෙරෙන සඳහන් කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද එකී යම් ප්‍රඥප්තියක විධිවිධාන උල්ලංඝනය වන පරිදි සිදු කරන ලදැයි කියන යම් වරදක් සම්බන්ධයෙන් මේ උපවගන්තියේ විධිවිධාන අදාළ නො විය යුතු ය.

(3) අයුතු ලෙස නැතහොත් නීති විරෝධී ලෙස අත් අඩංගුවේ තබා ගනු ලැබ ඇතැයි කියනු යම් බාලවයස්කාර දරුවකුගේ හෝ යම් විවාහයක, භාර්යාවකගේ නැතහොත් ස්වාමිපුරුෂයකුගේ හෝ භාරය සඳහා, එම බාලවයස්කාර දරුවාගේ හෝ එම ස්වාමිපුරුෂයාගේ හෝ භාර්යාවගේ දෙමාපියන්ගෙන් කෙනකු විසින් හෝ භාර්යාව නැතහොත් ස්වාමිපුරුෂයා විසින් හෝ භාරකරුවකු විසින්

විසින් විභාග කොට තීරණය කළ යුතු ය; තව ද එවැනි ඉල්ලීමක් විභාග කොට ඒ පිළිබඳ තීරණයක් කිරීමට හා ඒ කාරණය අනුව යුක්තිසහගතව අවශ්‍ය විය හැකි අතුරු ආඥාවක් හෝ අවසාන ආඥාවක් හෝ කිරීමට ද ඒ අධිකරණයට සම්පූර්ණ බලය හා අධිකරණ බලය තිබිය යුතු ය.

25. සිහිවිකල නැනැත්තන්ගේ සහ මානසික ඌනතා ඇති නැනැත්තන්ගේ ආරක්ෂාව සහ භාරය ද ඔවුන්ගේ දේපළ භාරය ද සම්බන්ධයෙන් 20 වන වගන්තිය යටතේ දිසා අධිකරණවල අධිකරණ බලය සහ බලතල, ඒ ආකාරයෙන් ම සහ ඒ බලතල ම ඇතිව බාලවයස්කාරයන්ගේ සහ රක්ෂිතයන්ගේ පුද්ගල ආරක්ෂාව ද ඔවුන්ගේ දේපළවල භාරය ද සම්බන්ධයෙන් පවුල් අධිකරණයක් විසින් ක්‍රියාත්මක කළ යුතු අතර, ඒ අධිකරණ බලය සහ බලතල ශ්‍රී ලංකාවෙහි වාසික නොවන බාලවයස්කාරයන්ගේ සහ රක්ෂිතයන්ගේ ශ්‍රී ලංකාවෙහි පිහිටි දේපළ භාරව සිටීම කෙරෙහි ද ව්‍යාප්ත විය යුතු ය.

බාලවයස්කාරයන්ගේ රැකවරණය සහ ඔවුන්ගේ දේපළ භාරය දීම.

26. (1) එක් එක් පවුල් අධිකරණයට අනුයුක්තව "පවුල් උපදේශක" යනුවෙන් හඳුන්වනු ලබන නිලධරයකු විය යුතු ය. යම් ආරාවුලක් සම්බන්ධයෙන් පවුල් අධිකරණයකට අධිකරණ බලය ඇත්තේ ද ඒ ආරාවුල, පරීක්ෂණය හෝ නඩු විභාගය සඳහා පවුල් අධිකරණයේ විනිශ්චයකාරවරයා වෙත යොමු කරනු ලැබීමට පෙර එම ආරාවුල සමථයට පත් කර ගැනීම සඳහා එහි පාර්ශ්ව කරුවන් පෙලඹවීමට සෑම ප්‍රයත්නයක් ම දැරීම ඒ නිලධරයාගේ කාර්යය විය යුතු ය.

පවුල් උපදේශක.

(2) එවැනි යම් ආරාවුලක් සමථයට පත් කරනු ලැබූ අවස්ථාවක සමථයට පත් කිරීමේ නියම වාර්තාගත කරනු ලැබිය යුතු අතර, ආරාවුලෙහි එක් එක් පාර්ශ්වය විසින් ද පවුල් උපදේශක විසින් ද එයට අත්සන් තැබිය යුතු ය. ඒ වාර්තාගත කරන ලද නියම පවුල් අධිකරණයේ විනිශ්චයකාරවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඒ නියම ඒ විනිශ්චයකාරවරයා විසින් ඒ අධිකරණයේ තීන්දු ප්‍රකාශයක් ලෙස වාර්තාගත කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් ආරාවුලක් සමථයට පත් කිරීමට පවුල් උපදේශකයකුට නොහැකි වන අවස්ථාවක ඒ ආරාවුල පරීක්ෂණයකින් හෝ නඩු විභාගයකින් පසු විනිශ්චය කිරීම සඳහා පවුල් අධිකරණයේ විනිශ්චයකාරවරයා වෙත යොමු කළ යුතු ය.

(4) පවුල් උපදේශකයකු විසින් (3) වන උපවගන්තිය යටතේ යම් ආරාවුලක් යොමු කරනු ලබන තුරු පවුල් අධිකරණයක කිසිම විනිශ්චයකාරවරයකු විසින් ඒ ආරාවුල සම්බන්ධයෙන් යම් පරීක්ෂණයක් හෝ නඩු විභාගයක් පවත්වනු නොලැබිය යුතු ය.

අභියාචන.

**27.** පවුල් අධිකරණයක් විසින් පරීක්ෂණයක් හෝ නඩු විභාගයක් පැවැත්වීමෙන් පසු ප්‍රකාශයට පත් කරන ලද යම් නඩු තීන්දුවකින්, තීන්දු ප්‍රකාශයකින් හෝ ආඥාවකින් අතෘප්තියට පත් යම් පාර්ශ්වකරුවකු විසින් දිසා අධිකරණයේ තීන්දුවකට විරුද්ධව කරන අභියාචනයක් ඉදිරිපත් කළ යුතු ආකාරය හා එය ඉදිරිපත් කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය පාලනය වන යම්කිසි නීතියකට, නියෝගයකට හෝ රීතියකට අනුකූලව, ඊට විරුද්ධව නීතිය පිළිබඳ හෝ සිද්ධිය පිළිබඳ වූ යම් දෝෂයක් මත අභියාචනාධිකරණය වෙත අභියාචනය කළ හැකි ය.

එක් පවුල් අධිකරණයකින් වෙනත් පවුල් අධිකරණයකට නඩු මාරු කිරීම සහ නඩු ඒකාබද්ධ කිරීම.

**28.** (1) එකම පවුලේ ආරාවුල සම්බන්ධයෙන් හෝ සාරානුකූලව එකම ආරාවුල වන පවුල් ආරාවුලක් සම්බන්ධයෙන් හෝ පවුල් අධිකරණ එකකට වැඩි ගණනක එකිනෙකට වෙනස් නඩු කටයුතු හෝ නඩු දෙකක් හෝ වැඩි ගණනක් පවරනු ලැබූ විට ඒ නඩු කටයුත්ත හෝ නඩුව මාරු කරන ලෙස ඒ නඩු කටයුත්තේ හෝ නඩුවේ යම් පාර්ශ්වකරුවකු විසින් අභියාචනාධිකරණයෙන් ඉල්ලුම් කළ හැකි ය; නැතහොත් ඒ නඩු කටයුත්ත හෝ නඩුව පවත්නා පවුල් අධිකරණයේ යම් විනිශ්චයකාරවරයකු විසින් ඒ කාරණය අභියාචනාධිකරණය වෙත යොමු කරනු ලැබිය හැකි ය. ඒ සියලු ආරාවුල් එක් පවුල් අධිකරණයක් විසින් පහසුවෙන් හා ඉක්මණින් විභාග කොට තීරණය කළ හැකි වන සේ අභියාචනාධිකරණය විසින් ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා සුදුසු යයි සලකන ආකාරයට ඒ නඩු කටයුතු හෝ නඩු එකක් හෝ වැඩි ගණනක්, ඒ වනවිට එකී පාර්ශ්වකරුවන් විසින් ඒ නඩු කටයුතු හෝ නඩු පවරනු ලැබ ඇති එක් පවුල් අධිකරණයකට මාරු කරනු ලැබිය යුතු ය.

(2) එකම පාර්ශ්වකරුවන් අතර හෝ සාරානුකූලව එකම කාරණයක් සම්බන්ධව එකම පවුල් අධිකරණයක පවරනු ලැබ ඇති හෝ විනිශ්චයට භාජනව පවත්නා නඩු කටයුතු හෝ නඩු, දෙකක් හෝ වැඩි ගණනක් ඇති විටක ඒ අධිකරණයේ මතය අනුව ඒ නඩු කටයුතු හෝ නඩු ඒකාබද්ධ කිරීමෙන් පහසුවක් වේ නම් හෝ යුක්තිය ඉටුවීම සඳහා සහ ආරාවුලට පාත්‍ර වී ඇති කාරණා පිළිබඳ කටයුතු අප්‍රමාදව අවසන් කිරීම සඳහා ඒ නඩු කටයුතු හෝ නඩු ඒකාබද්ධ කිරීම අවශ්‍ය වේ නම් ඒවා එසේ ඒකාබද්ධ කරන ලෙස විධාන කිරීමට ඒ අධිකරණයට බලය ඇත්තේ ය. එවැනි අවස්ථාවක දී අධිකරණය විසින් එම කාරණයේ අවශ්‍යතා අනුව සහ එම කාරණයේ දී යුක්තිය ඉටු කිරීම පිණිස කලින් කල අවශ්‍ය විය හැකි යම් ආඥාවක් කළ හැකි ය; යම් නඩු තීන්දුවක් ප්‍රකාශයට පත් කළ හැකි ය; යම් තීන්දු ප්‍රකාශයක් වාර්තාගත කළ හැකි ය.

පවුල් අධිකරණවල කාර්ය පටිපාටිය.

**29.** පවුල් අධිකරණයක සියලු නඩු කටයුතු, ඊට අදාළ විය හැකි යම් නීතියකට අනුකූලව ද එවැනි නීතියක් නොමැති නම් සිවිල් නඩු විධාන සංග්‍රහයේ ලඝු කාර්ය පටිපාටියට අදාළ විධිවිධානවලට අනුකූලව ද පැවරිය යුතු ය; එසේම හැකිතාක් ඉක්මණින් ඒ නඩු කටයුතු ඒ නීතියට අනුකූලව ඒ අධිකරණයේ දී පැවැත්විය යුතු ය:

එසේ වුව ද ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥාපනත සහ නඩත්තු ආඥාපනත යන ආඥාපනත් යටතේ නඩු කටයුතු පැවරීම සහ නඩු කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් බලපවත්නා,

ඒ ආඥාපනත්වල ඇති විධිවිධාන, පවුල් අධිකරණවල පවරනු ලබන එවැනි නඩු කටයුතු සම්බන්ධයෙන් අදාළ වන සේ සැලකිය යුතු ය:

එසේ ම තවදුරටත්, සෑම පවුල් අධිකරණයක ම බාලවයස්කාර ළමයින්ගේ රැකවරණය සහ භාරය සඳහා වන සියලු ඉල්ලීම්වලට අන් සියලු කාරණා අභිභවා ප්‍රමුඛත්වය දිය යුතු අතර, ඒවා එදිනෙදා විභාග නොකිරීමට ඇති විශේෂ අවස්ථාගත කරුණු ඇති වුවහොත් මිස, ඒ ඉල්ලීම් පිළිබඳ කටයුතු අප්‍රමාදව අවසාන වන බවට වගබලා ගැනීම පිණිස, ඒවා පිළිබඳ විභාග එදිනෙදා ම පැවැත්විය යුතු ය.

## VI වන පරිච්ඡේදය

## මහේස්ත්‍රාත් අධිකරණ

**30.** දණ්ඩ නීති සංග්‍රහයේ හෝ අපරාධ නඩු විධානයට අදාළ නීතියේ හෝ විධිවිධාන ප්‍රකාර නැතහොත් සියලු බලතල හා අධිකාර දරා ක්‍රියාත්මක කිරීමටත් සියලු කාර්ය ඉටු කිරීමටත් මහේස්ත්‍රාත් අධිකරණවලට කවර හෝ ආකාරයකින් බලය පවරන්නා වූ හෝ නියම කරන්නා වූ තත් කාලයෙහි බලපවත්නා වෙනත් යම් ප්‍රඥප්තියක විධිවිධාන ප්‍රකාර මහේස්ත්‍රාත් අධිකරණයන්ට යම් බල යක්, අධිකාරයක් හෝ කාර්යයක් පැවරී හෝ නියම වී ඇත්තේ ද ඒ සියලු බලතල, අධිකාර හා කාර්ය සෑම මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් ම දරා ක්‍රියාත්මක කළ යුත්තේ ය; නැතහොත් ඉටු කළ යුත්තේ ය. බලතල හා අධිකරණ බලය.

මේ වගන්තියේ කාර්ය සඳහා "අපරාධ නඩු විධානයට අදාළ නීතිය" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනත හෝ ඊට ආදේශ වශයෙන් පනවන ලද වෙනත් යම් නීතියක් හෝ අදහස් වේ.

**31.** මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් සටහන් කරනු ලැබූ හෝ නියම කරනු ලැබූ වරදකරු කිරීමකින්, දණ්ඩන නියමයකින් හෝ ආඥාවකින් අතෘප්තියට පත් යම් පාර්ශ්වකරුවකු විසින්, යම් නීති යක විධිවිධානවලට යටත් ව අභියාචනය කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය සහ ක්‍රමය පාලනය වන යම් නීතියකට, නියෝගයකට හෝ රීතියකට අනුකූලව, මහේස්ත්‍රාත් අධිකරණයේ ඒ වරදකරු කිරීමට, දණ්ඩන නියමයට හෝ ආඥාවට විරුද්ධව අභියාචනාධිකරණයට අභියාචනය කළ හැකි ය. අභියාචනය කිරීමේ අයිතිවාසිකම.

## VII වන පරිච්ඡේදය

## ප්‍රාථමික අධිකරණ

**32.** (1) ණය, අලාභය, ඉල්ලීම හෝ හිමිකම්පෑම රුපියල් එක් දහස් පන්සියය නොඉක්මවන අවස්ථාවක, වෙනත් යම් නීතියක විධිවිධානවලට යටත් ව සෑම ප්‍රාථමික අධිකරණයකට ම මුල් අධි කරණ බලය තිබිය යුතු අතර, පළාත් පාලන ආයතනවල අතුරු ව්‍යවස්ථා ක්‍රියාවේ යෙදවීම සම්බන්ධයෙන් සහ ඒ පළාත් පාලන ආයතනවල ආදායම අයකර ගැනීමට අදාළ කාරණා සම්බන්ධයෙන් අධිකරණ බලය ද එයට තිබිය යුතු ය. සිවිල් අධිකරණ බලය.

(2) ප්‍රාථමික අධිකරණවලට මෙහි හතරවන උපලේඛනයෙහි සඳහන් ආරාවුල් සම්බන්ධයෙන්, හිමිකම්පෑමේ වටිනාකම කුමක් වුව ද, අධිකරණ බලය නොතිබිය යුතු ය.

අපරාධ අධිකරණ බලය.

33. (1) අමාත්‍යවරයා විසින් නියෝගයක් මගින් නියම කරනු ලබන යම් වැරදි සම්බන්ධයෙන් අනන්‍ය මුල් අපරාධ අධිකරණ බලය සෑම ප්‍රාථමික අධිකරණයකට ම තිබිය යුතු අතර, ඒ ඒ වරද සම්බන්ධයෙන් වන විට ඒ එක් එක් වරද පිළිබඳ වූ සීමා කිරීම්, නියම කිරීම් හා කොන්දේසි අමාත්‍යවරයා විසින් ඒ නියෝගයෙහි සඳහන් කළ හැකි ය.

(2) යම් ප්‍රඥප්තියක හෝ ඒ යටතේ සාදන ලද යම් අනුනීතියක විධිවිධාන කඩ කරමින් සිදු කරන ලදැයි කියනු ලබන්නා වූ ද අධිකරණ බලය ප්‍රාථමික අධිකරණය වෙත පවරනු ලැබ ඇත්තා වූ ද සියලු වැරදි පිළිබඳ තනි හා අනන්‍ය අධිකරණ බලය ඒ ප්‍රාථමික අධිකරණයට තිබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් වරදක් සම්බන්ධයෙන් පවත්වනු ලැබූ නඩු විභාගයකින් පසු වරදකරු බවට තීරණය කරනු ලැබූ යම් තැනැත්තකු වරදකරු කිරීමෙන් හා ඔහුට දඬුවම් නියම කිරීමෙන් මේ වගන්තියෙහි වූ කිසිවකින් මහෙස්ත්‍රාත්වරයකු වළක්වනු නොලැබිය යුතු ය.

ආරාවුල් සමගි කිරීමේ කාර්යය.

34. (1) යම් සිවිල් නඩු කටයුත්තක් හෝ කාරණයක් ප්‍රාථමික අධිකරණයක පවරනු ලැබූ අවස්ථාවක, තමා ඉදිරිපිට පෙනී සිටින ලෙස පාර්ශ්වකරුවන් කැඳවා, පරීක්ෂණයක් පැවැත්වීමේ හෝ නඩු විභාගයක් පැවැත්වීමේ හෝ කටයුතු ආරම්භ කිරීමට පෙර උචිත කවර හෝ විටක බේරුමකට එළඹීම සඳහා ඒ පාර්ශ්වකරුවන් පෙළඹවීමට සෑම ප්‍රයත්නයක් ම දැරීම එම අධිකරණයේ විනිශ්චයකාරවරයාගේ කාර්යය විය යුතු ය. බේරුමකට එළඹීම සඳහා ඒ පාර්ශ්වකරුවන් එකඟවන අවස්ථාවක, ඒ බේරුම් කර ගැනීම වාර්තාගත කළ යුතු අතර පාර්ශ්වකරුවන් විසින් ඒ වාර්තාව අත්සන් කරනු ලැබිය යුතු ය. තව ද එය ඒ අධිකරණයේ තීන්දු ප්‍රකාශයක් වශයෙන් සටහන් කරනු ලැබිය යුතු අතර ඒ අධිකරණයේ තීන්දු ප්‍රකාශයක් ලෙස ක්‍රියාවේ යොදවනු ලැබිය යුතු ය.

(2) යම් අපරාධ නඩු කටයුත්තක් හෝ කාරණයක් ප්‍රාථමික අධිකරණයක පවරනු ලැබූ අවස්ථාවක, තමා ඉදිරිපිට පෙනී සිටින ලෙස සම්බන්ධිත පාර්ශ්වකරුවන් කැඳවා උචිත කවර හෝ විටක බේරුමකට එළඹීම සඳහා ඒ පාර්ශ්වකරුවන් පෙළඹවීම ඒ අධිකරණයේ විනිශ්චයකාරවරයාගේ කාර්යය විය යුතු ය. බේරුමකට එළඹීමට ඒ පාර්ශ්වකරුවන් එකඟවන අවස්ථාවක ඒ බේරුම්කර ගැනීම වාර්තාගත කළ යුතු අතර සම්බන්ධිත පාර්ශ්වකරුවන් විසින් ඒ වාර්තාව අත්සන් කරනු ලැබිය යුතු ය. තව ද වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද ඒ නඩු කටයුත්ත හෝ කාරණය අදාළ වන්නේ යම් වරදකට ද ඒ වරද සමථයට පත් කරනු ලැබිය යුතු ය.

35. (1) ප්‍රාථමික අධිකරණයක් විසින් පවත්වන ලද පරීක්ෂණයකින් හෝ නඩු විභාගයකින් පසුව සටහන් කරනු ලැබූ හෝ නියම කරනු ලැබූ යම් නඩු තීන්දුවකින්, ආඥාවකින්, තීන්දු ප්‍රකාශයකින්, වරදකරු කිරීමකින් හෝ දණ්ඩන නියමයකින් අතෘප්තියට පත් යම් පාර්ශ්වකරුවකු විසින් යම් නීතියකට යටත්ව සහ අභියාචනය කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය සහ ක්‍රමය පාලනය වන යම් නීතියකට, නියෝගයකට හෝ රීතියකට අනුකූලව, නීතිය පිළිබඳ වූ හෝ සිද්ධිය පිළිබඳ වූ හෝ යම් දෝෂයක් සම්බන්ධයෙන් ඒ නඩු තීන්දුවට, ආඥාවට, තීන්දු ප්‍රකාශයට, වරදකරු කිරීමට හෝ දණ්ඩන නියමයට විරුද්ධව අභියාචනාධිකරණයට අභියාචනය කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද එසේ අභියාචනය කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය සහ ක්‍රමය පාලනය වන එවැනි නීතියක්, නියෝගයක් හෝ රීතියක් නොමැති අවස්ථාවක මහේස්ත්‍රාත් අධිකරණයකින් ඉදිරිපත් කරනු ලබන අභියාචනවලට අදාළ විධිවිධාන අපරාධ කාරණයක හෝ නඩු කටයුත්තක අභියාචනයක් සම්බන්ධයෙන් අදාළ විය යුතු අතර දිසා අධිකරණයකින් ඉදිරිපත් කරනු ලබන අභියාචනවලට අදාළ විධිවිධාන සිවිල් කාරණයක හෝ නඩු කටයුත්තක අභියාචනයක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) පාර්ශ්වකරුවන් අතර වූ ආරාවුල මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ බේරුම් කර ගැනීමේ හේතුවෙන් සටහන් කරනු ලැබූ හෝ නියම කරනු ලැබූ යම් නඩු තීන්දුවකට, ආඥාවකට, තීන්දු ප්‍රකාශයකට, වරදකරු කිරීමකට හෝ දණ්ඩන නියමයකට විරුද්ධව අභියාචනයක් කළ නොහැකි විය යුතු ය.

36. ප්‍රාථමික අධිකරණයක සියලු නඩු කටයුතු ඊට අදාළ කරනු ලැබිය හැකි යම් නීතියකට අනුකූලව ද එවැනි නීතියක් නොමැති නම් සිවිල් කාරණයක් හෝ නඩු කටයුත්තක් සම්බන්ධයෙන් වූ විට සිවිල් නඩු විධාන සංග්‍රහයේ ලඝු කාර්ය පටිපාටිය අදාළ විධිවිධානවලට අනුකූලව ද අපරාධ කාරණයක් හෝ නඩු කටයුත්තක් සම්බන්ධයෙන් වූ විට මහේස්ත්‍රාත් අධිකරණයක ලඝු නඩු විභාගවලට අදාළ විධිවිධානවලට අනුකූලව ද හැකිතාක් ඉක්මණින් පවරා පවත්වා ගෙන යා යුතු ය.

## VIII වන පරිච්ඡේදය

## පොදු විධිවිධාන

37. මහාධිකරණයෙන්, දිසා අධිකරණවලින්, පවුල් අධිකරණවලින් හෝ මහේස්ත්‍රාත් අධිකරණවලින් ඉදිරිපත් කෙරෙන යම් අභියාචනයක් පිළිබඳ අභියාචනාධිකරණයේ යම් නඩු තීන්දුවක් හෝ ආඥාවක් සම්බන්ධයෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ වෙනත් යම් නීතියක විධිවිධානවලට අනුකූලව, ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කිරීමේ අයිතිවාසිකමක් තිබිය යුතු ය.

අභියාචනා.

ප්‍රාථමික අධිකරණවල කාර්ය පටිපාටිය.

ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කිරීමේ අයිතිවාසිකම.

අභියාචනයේ දී කරනු ලබන නඩු තීන්දු ආදිය මුල් අවස්ථා අධිකරණ විසින් ක්‍රියාවේ යෙදවිය යුතු බව.

38. මුල් අවස්ථා අධිකරණයකින් අභියාචනාධිකරණයට සහ ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනය කරනු ලැබූ සියලු අවස්ථාවල දී අවස්ථාවෝචිත පරිදි, අභියාචනාධිකරණය විසින් හෝ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් හෝ ඒ අභියාචනයේ දී කරනු ලැබ, ප්‍රකාශ කරනු ලැබූ සියලු නඩු තීන්දු, ආඥා සහ තීන්දු ප්‍රකාශ, එකී මුල් අවස්ථා අධිකරණය විසින් කරන ලද හෝ ප්‍රකාශ කරන ලද නඩු තීන්දුවක්, ආඥාවක් හෝ තීන්දු ප්‍රකාශයක් වූවාක් මෙන් ඒ මුල් අවස්ථා අධිකරණය විසින් පිළිපැද, ක්‍රියාවේ යෙදවිය යුතු ය.

අධිකරණ බලය සම්බන්ධයෙන් විරෝධය පෑම.

39. යම් මුල් අවස්ථා අධිකරණයක පවරනු ලැබූ යම් නඩුවක දී, නඩු කටයුත්තක දී හෝ කාරණයක දී යම් විත්තිකරුවකු හෝ චූදිත පාර්ශ්වකරුවකු විසින් උත්තරවාද ඉදිරිපත් කරනු ලැබූ කවර විටක වුව ද, ඒ අධිකරණයේ අධිකරණ බලය පිළිබඳව පසුව විරෝධය පෑමට ඒ විත්තිකරුට හෝ චූදිත පාර්ශ්වකරුට හිමිකම නොතිබිය යුතු අතර ඒ අධිකරණයට ඒ නඩුව, නඩු කටයුත්ත හෝ කාරණය විෂයයෙහි අධිකරණ බලය තිබෙන ලෙස සැලකිය යුතු අතර එසේ අධිකරණ බලය තිබෙන බව පිළිගත යුතු ය:

එසේ වුව ද, චේතනාන්විතව ම සහ යම් අධිකරණයකට අධිකරණ බලය නැති බවට පූර්ව දැනීම ඇතිව ඒ නඩුව, නඩු කටයුත්ත හෝ කාරණය පවරනු ලැබූ බව නඩු කටයුතු පවත්වා ගෙන යන අතර තුර පෙනී යන අවස්ථාවක, ඒ සම්බන්ධයෙන් තම අභිමතය අනුව තවදුරටත් කටයුතු කිරීම ප්‍රතික්ෂේප කිරීමට සහ නඩු කටයුතු ශූන්‍ය හා බල රහිත බව ප්‍රකාශ කිරීමට විනිශ්චයකාරවරයාට හිමිකම තිබිය යුතු ය.

නීතිඥවරයෝ.

40. (1) යහපත් කීර්තියක්, මනා දැනීමක් හා දක්ෂතාවක් ඇති තැනැත්තන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින්, තත් කාලයෙහි බල පවත්නා රීතිවලට අනුකූලව නීතිඥවරයන් වශයෙන් පිළිගැනීමත්, එලෙස බඳවා ගැනීමත් කළ හැකි ය.

(2) ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් යම් තැනැත්තකු පිළිගැනීම සඳහා යම් ආඥාවක් යථා පරිදි කරනු ලැබූ විට, ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින්, එසේ පිළිගනු ලැබූ තැනැත්තා ඉහත කී පරිදි නීතිඥවරයකු වශයෙන් පිළිගනු ලැබූ බව සහතික කරමින් ඒ රෙජිස්ට්‍රාර්වරයාගේ අත්සන සහ ඉහත කී අධිකරණයේ මුද්‍රාව යටතේ වූ ලියවිල්ලක් ඒ තැනැත්තාට ඒ පිළිගැනීම කරනු ලබන අවස්ථාවේ දී, නිකුත් කොට, භාර දිය යුතු අතර, එසේ කළ යුතු බවට ඔහුට මෙයින් නියම කරනු ලැබේ. තව ද එසේ පිළිගනු ලැබූ විට මුද්දර ආඥාපනතේ 'අ' උපලේඛනයෙහි V වන කොටසෙහි 1(අ) විෂයයෙහි දැක්වෙන මුද්දර ගාස්තුව ගෙවනු ලැබිය යුතු ය.

(3) මුද්දර ගාස්තුවට අදාළ (2) වන උපවගන්තියේ විධිවිධාන 1974 ජනවාරි මස 1 වන දින ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

නියෝජනය කිරීමේ අයිතිවාසිකම.

**41.** (1) සේවාදායකයන්ට සහාය වීමේ හා උපදෙස් දීමේත්, යුක්තිය පසිඳලීම සඳහා නීතියෙන් පිහිටුවනු ලැබූ සෑම අධිකරණයක ම හෝ වෙනත් ආයතනයක ම පෙනී සිටීමේ, උත්තරවාද ඉදිරිපත් කිරීමේ හෝ ක්‍රියා කිරීමේත් හිමිකම සෑම නීතිඥවරයකුට ම තිබිය යුතු අතර, එකී යම් අධිකරණයක හෝ එකී වෙනත් ආයතනයක යම් නඩු කටයුත්තක පාර්ශ්වකරුවකු වන්නා වූ හෝ ඒ නඩු කටයුත්තේ දී කරුණු ඉදිරිපත් කිරීමට අයිතිවාසිකමක් ඇති හෝ ඇතැයි හිමිකම් පාන්නා වූ හෝ සෑම තැනැත්තකුට ම නීතිඥවරයකු විසින් තමා නියෝජනය කරනු ලැබීමට හිමිකම තිබිය යුතු ය.

(2) අර්ධ අධිකරණ බලතල ක්‍රියාත්මක කරන්නා වූ යම් තැනැත්තකු හෝ විනිශ්චය අධිකාරයක් ඉදිරියේ වූ යම් නඩු කටයුත්තක පාර්ශ්වකරුවකු වන්නා වූ සෑම තැනැත්තකුට ම සහ එවැනි යම් තැනැත්තකු හෝ විනිශ්චය අධිකාරයක් ඉදිරියේ කරුණු ඉදිරිපත් කිරීමට අයිතිවාසිකමක් ඇත්තා වූ හෝ අයිතිවාසිකමක් ඇති හෝ ඇතැයි හිමිකම් පාන්නා වූ සෑම තැනැත්තකුට ම, නීතියෙන් අන්‍යාකාර විධිවිධාන ප්‍රකාශිතව ම සලසනු ලැබ තිබේ නම් මිස, නීතිඥවරයකු විසින් තමා නියෝජනය කරනු ලැබීමට හිමිකම තිබිය යුතු ය.

නීතිඥ ධුරයට පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීම සහ නීතිඥ ධුරයෙන් අත්හිටුවීම හා ඉවත් කිරීම.

**42.** (1) නීතිඥවරයකු වශයෙන් පිළිගැනීමට සහ බඳවා ගැනීමට ඉල්ලුම් කරන්නා වූ යම් තැනැත්තකු එසේ පිළිගනු ලැබීම සහ බඳවා ගනු ලැබීම ප්‍රතික්ෂේප කිරීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට තිබිය යුතු අතර, එසේ ප්‍රතික්ෂේප කිරීමට හේතු දක්වන ලෙස ඉල්ලුම්කරු විසින් ඉල්ලා සිටිය හොත්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විවෘත අධිකරණයේ දී, එසේ ප්‍රතික්ෂේප කිරීමට හේතු දක්වා ප්‍රකාශ කළ යුතු ය.

(2) නීතිඥවරයකු වශයෙන් පිළිගනු ලැබූ සහ බඳවා ගනු ලැබූ සහ යම් වංචාවක්, අයථා ක්‍රියාවක්, අපරාධයක් හෝ වරදක් සම්බන්ධයෙන් වරදකරු වන්නා වූ සෑම තැනැත්තකු ම නීතිඥ වෘත්තියෙහි යෙදීම අත්හිටුවීම හෝ ඔහු ධුරයෙන් ඉවත් කිරීම හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ එකට රැස්වන යම් විනිශ්චයකාරවරයන් තිදෙනකු විසින් කළ හැකි ය.

(3) නීතිඥවරයකුට විරුද්ධව ඇති චෝදනාවේ හෝ චෝදනාවල පිටපතක් ඇතුළත් සහ අවස්ථාවෝචිත පරිදි, ඔහු වෘත්තියෙහි යෙදීම අත්හිටුවීම හෝ ඔහු ධුරයෙන් ඉවත් කිරීම හෝ නොකළ යුත්තේ මන්දැයි දැන්වීමේ සඳහන් කරනු ලබන සාධාරණ කාලයක් ඇතුළත හේතු දක්වන ලෙස ඔහුට නියම කරමින් දැන්වීමක් ඔහුට පෞද්ගලිකව භාරදෙනු ලැබුවහොත් මිස මෙහි ඉහත විධිවිධාන සලසා ඇති පරිදි කිසිම නීතිඥවරයකු වෘත්තියෙහි යෙදීම අත්හිටවනු ලැබීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම නොකළ

යුතු ය. එසේ ඒ දැන්වීම පෞද්ගලිකව භාරදීම කළ නොහැකි වුව හොත් සුදුසු යයි ශ්‍රේෂ්ඨාධිකරණය සලකන මනිමාත්‍ර භාරදීමක් කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ආඥා කළ යුතු ය :

එසේ වුව ද, ශ්‍රේෂ්ඨාධිකරණයේ අවසාන තීරණය ලැබෙන තුරු, ශ්‍රේෂ්ඨාධිකරණයේ යම් විනිශ්චයකාරවරයකු විසින්, ඉහත කී හේතුවක් මත එවැනි යම් නීතිඥවරයකු වෘත්තියෙහි යෙදීම අත්හිටු වනු ලැබිය හැකි ය.

(4) නියම කරනු ලබන යම් අපරාධයක් හෝ වරදක් සම්බන්ධ යෙන් යම් නීතිඥවරයකු වරදකරු යයි තීරණය කරනු ලැබුවේ යම් අධිකරණයක් හෝ යුක්තිය පසිඳලන වෙනත් විනිශ්චය අධිකාර යක් ඉදිරියේ ද ඒ අධිකරණයේ හෝ විනිශ්චය අධිකාරයේ මූලාසනය දරන නිලධරයා විසින් ඒ සිද්ධිය වහාම ශ්‍රේෂ්ඨාධිකරණය වෙත වාර්තා කළ යුතු අතර වරදකරු කිරීමේ තීරණයට විරුද්ධව වූ යම් අභියාචනයක් සම්බන්ධයෙන් අවසාන වශයෙන් නිශ්චය කිරීම හෝ (3) වන උපවගන්තිය යටතේ වූ නඩු කටයුත්තක් සම්බන්ධයෙන් අවසාන වශයෙන් නිශ්චය කිරීම යන මේ දෙකින් පසුව එළඹෙන අවස්ථාව තෙක් ඒ නීතිඥවරයා වෘත්තියෙහි යෙදීම අත්හිටුවීම සුදුසු යයි ශ්‍රේෂ්ඨාධිකරණය කල්පනා කරන්නේ නම් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එසේ කළ හැකි ය.

නීතිඥවරයකු විසින් කරන ලදැයි කියනු ලබන විෂමාචාර පිළිබඳව විනය කාරක සභාව විසින් පරීක්ෂණ පැවැත්වීම.

43. (1) යම් නීතිඥවරයකු වෘත්තියෙහි යෙදීම අත්හිටුවීම සඳහා හෝ ඔහු ධුරයෙන් ඉවත් කිරීම සඳහා නඩු කටයුතු පවත්වා ගෙන යාම ආරම්භ කළ යුතු ද නැද්ද යන වග නිශ්චය කිරීමට අධිකරණයට හැකි කරවීමේ කාර්යය සඳහා මේ පනතේ පසුව දැක් වෙන විධිවිධානවලට අනුකූලව සංස්ථාපනය කරනු ලැබූ ශ්‍රී ලංකා නීතිඥ සම්මේලනයේ විනය කාරක සභාවක් විසින් ඒ නීතිඥවරයා විසින් කරන ලදැයි කියනු ලබන විෂමාචාරය පිළිබඳව මූලික පරීක්ෂ ණයක් පවත්වනු ලැබීම යෝග්‍ය යයි හෝ අවශ්‍ය යයි අග්‍ර විනිශ්චය කාරවරයා හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ යම් විනිශ්චයකාරවරයකු සලකන අවස්ථාවක, එලෙස එවැනි මූලික පරීක්ෂණයක් පවත්වනු ලැබිය යුතු යයි අග්‍ර විනිශ්චයකාරවරයා හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ ඒ විනිශ්චයකාරවරයා විසින් හෝ ආඥාවක් මගින් විධාන කරනු ලැබිය හැකි ය.

(2) යම් නීතිඥවරයකු සම්බන්ධයෙන් 42 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ නඩු කටයුතු පවත්වාගෙන යාම ආරම්භ කිරීමට පෙර, (1) වන උපවගන්තියෙහි විධිවිධාන සලසා ඇති පරිදි මූලික පරීක්ෂණයක් පවත්වනු ලැබිය යුතු යයි විධාන කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට හෝ එහි යම් විනිශ්චයකාරවරයකුට නියම කරන්නක් ලෙස ඒ උපවගන්තියෙහි වූ කිසිවක් තේරුම් නොගත යුතු ය.

(3) ඒ විනය කාරක සභාවේ යම් සාමාජිකයකු විසින් හෝ එහි ලේකම්වරයා විසින් හෝ ඒ සාමාජිකයා වශයෙන් වූ හෝ ලේකම් වරයා වශයෙන් වූ තත්ත්වයෙන් කරනු ලැබූ හෝ නොකර හරිනු ලැබූ යම් ක්‍රියාවක් හෝ දෙයක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයා හෝ

ලේකම්වරයා යම් සිවිල් හෝ අපරාධ අධිකරණයක දී යම් සිවිල් නඩුවකට, අපරාධ නඩුවකට හෝ වෙනත් නඩු කටයුත්තකට හෝ යටත් නොවිය යුතු ය.

විනය කාරක සභා.

**44.** (1) ඉහතින් වූ වගන්තියෙන් නියම කරනු ලැබූ පරීක්ෂණ පැවැත්වීම පිණිස විනය කාරක සභා සංස්ථාපනය කිරීමේ කාර්ය සඳහා අග්‍ර විනිශ්චයකාරවරයා විසින් ශ්‍රී ලංකා නීතිඥ සම්මේලනයේ සාමාජිකයන් පහළොස් දෙනකුට නොඅඩු සංඛ්‍යාවක මූල මණ්ඩලයක් පත් කරනු ලැබිය යුතු ය.

(2) මූල මණ්ඩලයට පත් කරනු ලැබූ සෑම සාමාජිකයකු ම, අග්‍ර විනිශ්චයකාරවරයා විසින් තම අභිමතය අනුව ක්‍රියා කරමින්, ඔහු මූල මණ්ඩලයෙන් කලින් ඉවත් කරනු ලැබුවහොත්, හෝ ඉල්ලා අස්වීම නිසා හෝ ශ්‍රී ලංකා නීතිඥ සම්මේලනයේ සාමාජිකයකු වීම නතරවීම නිසා හෝ ඔහුගේ ධුරය කලින් හිස් වුවහොත් හෝ හැර ඔහුගේ පත්වීමේ දින සිට අවුරුදු තුනක් වූ කාලයක් මූල මණ්ඩලයේ සාමාජිකයකු විය යුතු ය. කාලය ඉකුත්වීම නිසා මූල මණ්ඩලයේ තම සාමාජික ධුරය හිස් කරන සෑම මූල මණ්ඩල සාමාජිකයෙක් ම නැවත නාමයෝජනා කරනු ලැබීම සඳහා සහ නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(3) මූල මණ්ඩලයේ ඇති වන යම් අනියම් පුරප්පාඩුවක් අග්‍ර විනිශ්චයකාරවරයා විසින් පිරවිය හැකි ය.

(4) මේ පනතේ 43 වන වගන්තිය යටතේ යම් විනය කාරක සභාවක් විසින් පරීක්ෂණයක් පැවැත්වීමට නියම කර ඇති අවස්ථාවක, අග්‍ර විනිශ්චයකාරවරයා විසින් පරීක්ෂණය පිළිබඳ කාර්යය සඳහා විනය කාරක සභාවක් සංස්ථාපනය කිරීම පිණිස මූල මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් තුන් දෙනකු පත් කළ යුතු අතර, ඒ කාරක සභාවේ සභාපතිවරයා වශයෙන් ඔවුන්ගෙන් එක් තැනැත්තකු ද පත් කළ යුතු ය.

සමාදාන විනිශ්චයකාරවරයෝ සහ නිල නොලත් මහෙස්ත්‍රාත්වරයෝ.

**45.** (1) ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයා, පාර්ලිමේන්තුවේ කථානායකවරයා, රාජ්‍ය අමාත්‍යවරයන් සහ මෙහි පස්වන උපලේඛනයෙහි සඳහන් කරනු ලැබ ඇති (ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ ධුර දරන්නා වූ) නිලධරයන් ශ්‍රී ලංකා ජනරජය සඳහා හෝ එකී උපලේඛනයෙහි පිළිවෙළින් දක්වා ඇති එහි යම් කොටසක් සඳහා හෝ නිල බලයෙන් පත් වන සමාදාන විනිශ්චයකාරවරයන් විය යුතු ය.

(2) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින් අමාත්‍යවරයා විසින්, ඒ දැන්වීමෙහි නම් කරනු ලබන යම් තැනැත්තන් ශ්‍රී ලංකා ජනරජය සඳහා හෝ යෝග්‍ය යයි අමාත්‍යවරයාට පෙනී යන යම් කලාප, දිස්ත්‍රික්ක හෝ කොට්ඨාස සඳහා සමාදාන විනිශ්චයකාරවරයන් වශයෙන් කලින් කල පත් කරනු ලැබිය හැකි ය.

(3) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් අමාත්‍යවරයා විසින් යම් අධිකරණ කොට්ඨාසයක් හෝ කොට්ඨාස සඳහා නිල නොලත් මහෙස්ත්‍රාත්වරයකු වශයෙන් නීතිඥවරයකු වන යම් සමාදාන විනිශ්චයකාරවරයකු කලින් කල පත් කරනු ලැබිය

හැකි අතර, යම් අපරාධ නඩුවක් විභාග කිරීමට, නඩු විභාග කිරීමට හෝ තීරණය කිරීමට මහේස්ත්‍රාත් අධිකරණයට ඇති බලය හා අධිකාරය හැර, මහේස්ත්‍රාත් අධිකරණ වෙත මේ පනත මගින් පවරා ඇති සියලු බලතල හා අධිකාරය එසේ පත් කරනු ලැබූ යම් සමාදාන විනිශ්චයකාරවරයකුට තිබිය යුතු ය.

(4) (2) වන සහ (3) වන උපවගන්ති යටතේ පත් කරනු ලැබූ සෑම සමාදාන විනිශ්චයකාරවරයකු ම විසින් සහ සෑම නිල නොලත් මහේස්ත්‍රාත්වරයකු ම විසින් මහාධිකරණ විනිශ්චයකාරවරයකු, දිසා විනිශ්චයකාරවරයකු, පවුල් අධිකරණ විනිශ්චයකාරවරයකු හෝ මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි, අමාත්‍යවරයා නිශ්චය කරන ආකෘතියකින් වූ ධුරයේ ප්‍රතිඥාවක් හෝ දිවුරුමක් දී ඊට අත්සන් තැබිය යුතු අතර ඒ ධුරයේ ප්‍රතිඥාව හෝ දිවුරුම දීම සලස්වන ලෙස ඉල්ලීමක් කරනු ලැබූ විට එය දීමට සැලැස්වීමටත් එකී ප්‍රතිඥාව හෝ දිවුරුම යථා පරිදි දෙනු ලැබූ බව තම අධිකරණයේ වාර්තාවල සටහන් කිරීමටත් ඒ සටහනේ පිටපතක්, ශ්‍රේෂ්ඨාධිකරණයේ වාර්තාවල ඇතුළත් කරනු ලැබීම පිණිස ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත වහාම යැවීමටත් ඒ සෑම විනිශ්චයකාර වරයකුට ම බලය පවරන අතර, එසේ කිරීමට නියම කරනු ලැබේ.

(5) මේ වගන්තියෙහි විධිවිධාන ක්‍රියාත්මක කරනු ලබන දිනයට ඉහතින් වූ දිනයෙහි පිළිවෙළින් සමාදාන විනිශ්චයකාරවරයන් වූ හෝ නිල නොලත් මහේස්ත්‍රාත්වරයන් වූ සියලු තැනැත්තන් ඒ ධුරය තවදුරටත් දැරිය යුතු අතර, සියලු කාර්ය සඳහා ඔවුන් මේ පනත යටතේ පත් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

එක් අධිකරණයකින් වෙනත් අධිකරණයකට නඩු මාරු කිරීම.

46. (1) (අ) යම් අධිකරණයක දී හෝ ස්ථානයක දී සාධාරණ සහ අපක්ෂපාත නඩු විභාගයක් පැවැත්විය නොහැකි බව ; හෝ

(ආ) අසාමාන්‍ය දුෂ්කරතාවකින් යුත් නීතිය පිළිබඳ ප්‍රශ්න කිසිවක් උද්ගත වීමට ඉඩ ඇති බව ; හෝ

(ඇ) යම් ස්ථානයක හෝ යම් ස්ථානයක් අසල හෝ යම් වරදක් සිදු කරන ලදැයි කියනු ලබන විට ඒ ස්ථානය නැරඹීම, ඒ වරද පිළිබඳව සතුටුදායක පරීක්ෂණයක් හෝ නඩු විභාගයක් පැවැත්වීම පිණිස අවශ්‍ය විය හැකි බව ; හෝ

(ඈ) වෙනත් යම් හේතුවක් නිසා මාරු කිරීම යෝග්‍ය බව

අභියාචනාධිකරණයට පෙනී යන කවර අවස්ථාවක වුව ද, යම් අධිකරණයක් ඉදිරියෙහි විනිශ්චයට භාජනව පවතින යම් නඩුවක්, අපරාධ නඩුවක්, නඩු කටයුත්තක් හෝ කාරණයක්, නඩු ගාස්තු ගෙවීම හෝ අන්‍යාකාරයකින් හෝ සුදුසු යයි අභියාචනාධිකරණය කල්පනා කරන කොන්දේසි මත, වෙනත් යම් අධිකරණයකට මාරු කිරීම සඳහා අභියාචනාධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය. තව ද, ඒ අනුව, එවැනි සෑම අවස්ථාවක දී ම, එවැනි යම් නඩුවක්, අපරාධ නඩුවක්, නඩු කටයුත්තක් හෝ කාරණයක් එසේ මාරු කරනු ලැබුවේ යම් අධිකරණයකට ඒ අධිකරණය විසින් මේ පනතේ හෝ වෙනත් යම් නීතියක හෝ

නඩු කටයුත්ත හෝ කාරණය සංස්ථාපනය කළ යුතු අතර ඒ නඩුව, අපරාධ නඩුව, නඩු කටයුත්ත හෝ කාරණය, ඒ අධිකරණයට මුල් බලය හා අධිකරණ බලය තිබූ පරිද්දෙන්, සියලු අභිප්‍රාය හා කාර්ය සඳහා සම්පූර්ණයෙන් හා බලාත්මක ලෙස විභාග කිරීමට, නඩු විභාග කිරීමට සහ නිර්ණය කිරීමට, ඒ අධිකරණයට බලය හා අධිකරණ බලය තිබිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ යම් සිවිල් නඩුවක්, අපරාධ නඩුවක්, නඩු කටයුත්තක් හෝ කාරණයක් එක් අධිකරණයකින් වෙනත් අධිකරණයකට මාරු කිරීම සඳහා වූ සෑම ඉල්ලීමක් ම, ඒ ඉල්ලීම පදනම් වූ හේතු දක්වන දිවුරුම් පත්‍රයකින් සනාථ කරනු ලැබිය යුතු ය.

(3) ඒ නඩුව, අපරාධ නඩුව, නඩු කටයුත්ත හෝ කාරණය මාරු කරනු ලැබුවේ යම් අධිකරණයකින් ද ඒ අධිකරණය ඉදිරියේ විභාග කරනු ලැබූ සාක්ෂිකරුවන් සියලු දෙනා ම හෝ ඉන් යම් සාක්ෂිකරුවකු හෝ කැඳවා, ඔවුන්ගේ සාක්ෂි අලුතින් ගැනීම සුදුසු යයි මේ වගන්තිය යටතේ මාරු කිරීමක් සඳහා වූ ආඥාවක් කිරීමේ දී, අභියාචනාධිකරණය කල්පනා කරන්නේ නම්, එසේ කළ යුතු ලෙස ඒ නඩුව, අපරාධ නඩුව, නඩු කටයුත්ත හෝ කාරණය මාරු කරනු ලැබූ අධිකරණයට අභියාචනාධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි ය.

47. (1) යම් අපරාධ වරදක් පිළිබඳ යම් පරීක්ෂණයක් හෝ නඩු විභාගයක් යම් අධිකරණයකින් හෝ යම් ස්ථානයකින් වෙනත් යම් අධිකරණයකට හෝ ස්ථානයකට මාරු කිරීම යෝග්‍ය යයි නීතිපතිවරයාට පෙනී යන කවර විටක වුව ද, ලියවිල්ලකින් වූ තම ආඥප්තියක් මගින් නීතිපතිවරයා විසින් තම අභිමතය පරිදි, එකී වෙනත් යම් අධිකරණය හෝ ස්ථානය නම් කරනු ලැබීම නීත්‍යනුකූල විය යුතු ය. තව ද ඒ අනුව ඒ පරීක්ෂණය හෝ නඩු විභාගය හෝ ඒ ආඥප්තියේ බලය යටතේ පවත්වනු ලැබිය යුතු අතර, ඒ ආඥප්තිය, ඉහත කී පරිදි මාරු කරනු ලැබූ ඒ පරීක්ෂණය හෝ නඩු විභාගය පිළිබඳ නඩු කටයුතු වාර්තාව සමග ගොනු කර තැබිය යුතු ය.

පරීක්ෂණය හෝ නඩු විභාගය පැවැත්විය යුතු අධිකරණය හෝ ස්ථානය නිශ්චය කිරීමට නීතිපතිවරයාට ඇති බලය.

(2) නීතිපතිවරයාගේ එවැනි ආඥප්තියක් යටතේ කරන ලද යම් මාරු කිරීමක් සම්බන්ධයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, ඒ පරීක්ෂණය හෝ නඩු විභාගය හෝ ආපසු මාරු කරන ලෙස නැතහොත් වෙනත් යම් අධිකරණයකට හෝ ස්ථානයකට හෝ මාරු කරන ලෙස ඉල්ලීමක්, ඒ ඉල්ලීමට හේතු දක්වෙන දිවුරුම් පත්‍රයකින් සනාථ කරනු ලබන මෝසමක මාර්ගයෙන්, අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කළ හැකි අතර, අභියාචනාධිකරණය විසින්, නීතිපතිවරයා වෙත දැනුම්දීමෙන් පසු හා ඒ මෝසමට විරුද්ධව කරුණු දැක්වීම සුදුසු යයි නීතිපතිවරයා කල්පනා කරන්නේ නම්, ඒ කරුණු නීතිපතිවරයාගෙන් ඇසීමෙන් පසු, ඒ ඉල්ලීමට ඉඩ දිය යුතු බවට පිළිගත හැකි හේතු ඉදිරිපත් කර ඇති බව අභියාචනාධිකරණය සලකන්නේ නම්, ඒ අනුව අභියාචනාධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(3) මේ පරිච්ඡේදය යටතේ මාරු කිරීමක් සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කරන සෑම තැනැත්තකු ම විසින් ඒ ඉල්ලීම පිළිබඳ ලිඛිත දැන්වීමක්, ඒ ඉල්ලීම කරනු ලබන්නේ යම් හේතු මත ද, ඒ හේතුවල පිටපතක් ද සමග නීතිපතිවරයාට සහ අවස්ථාවෝචිත පරිදි, චූදිතයාට හෝ පැමිණිලිකරුට දිය යුතු ය. ඒ දැන්වීම ලැබීමත් ඒ ඉල්ලීම සම්බන්ධයෙන් විභාගයක් පැවැත්වීමත් අතර යටත් පිරිසෙයින් පැය හතළිස් අටක්වත් ගත වූවහොත් හැර හා ගත වන තුරු, ඒ ඉල්ලීමේ කුසලතා මත කිසිම ආඥාවක් නොකළ යුතු ය. ඉහතින් වූ වගන්තිය යටතේ මාරු කිරීමක් සඳහා ඉල්ලීමක් කරන සෑම චූදිත තැනැත්තකු ම විසින්, තමා වරදකරු කරනු ලැබුවහොත් චෝදක පක්ෂයේ නඩු ගාස්තු ගෙවන බවට වූ කොන්දේසිය ඇතුළත් බැඳුම්කරයක් ඇපකරුවකු ඇතිව හෝ නැතිව ලියා අත්සන් කළ යුතු යයි අභියාචනාධිකරණය විසින් ස්වකීය අභිමතය පරිදි. නියම කරනු ලැබිය හැකි ය.

විනිශ්චයකාරවරයකු අශක්‍යතාවට පත් වීමට පෙර ඔහු ඉදිරියෙහි ආරම්භ කර තිබුණු යම් නඩුවක් පවත්වා ගෙන යාම සඳහා විධිවිධාන.

48. නඩු විභාගය ඉහළ අධිකරණයට තැබීමට පෙර වූ යම් පරීක්ෂණයක් සඳහා හෝ අනාකාරයකින් යම් නඩුවක්, අපරාධ නඩුවක්, නඩු කටයුත්තක් හෝ කාරණයක් පවරනු ලැබ ඇත්තේ හෝ විනිශ්චයට භාජනව ඇත්තේ යම් විනිශ්චයකාරවරයකු ඉදිරියෙහි ද, ඒ විනිශ්චයකාරවරයා මිය ගිය, රෝගාතුර වූ, ඉල්ලා අස් වූ, ධුරයෙන් ඉවත් කරනු ලැබූ, ශ්‍රී ලංකාවෙන් බැහැර සිටින්නා වූ, හෝ වෙනත් අශක්‍යතාවකට පත් වූ අවස්ථාවක, ඒ නඩුව, අපරාධ නඩුව, නඩු කටයුත්ත හෝ කාරණය ඒ විනිශ්චයකාරවරයා වෙනුවට අනුප්‍රාප්තික විනිශ්චයකාරවරයා ඉදිරියෙහි දිගටම පවත්වා ගෙන යා හැකි අතර, ඒ අනුප්‍රාප්තික විනිශ්චයකාරවරයාට තම පූර්වගාමී විනිශ්චයකාරවරයා විසින් එවකටත් සටහන් කර තිබූ සාක්ෂි මත හෝ කොටසක් තම පූර්වගාමී විනිශ්චයකාරවරයා විසින් ද කොටසක් තමා විසින් ද සටහන් කර ගනු ලැබූ සාක්ෂි මත හෝ ක්‍රියා කිරීමට නැතහොත් සාක්ෂිකරුවන් නැවත කැඳවා නඩු කටයුතු අලුතින් ආරම්භ කිරීම සුදුසු යයි තමා කල්පනා කරන්නේ නම් එසේ කිරීමට ද බලය තිබිය යුතු ය:

එසේ වුව ද, නඩු විභාගය ඉහළ අධිකරණයට තැබීමට පෙර වූ යම් පරීක්ෂණයක දී හැර, ඉහත සඳහන් කවර හෝ අවස්ථාවක දී, සාක්ෂිකරුවන් නැවත කැඳවා, නැවත සාක්ෂි විභාග කළ යුතු යයි පාර්ශ්වකරුවන් දෙදෙනා අතුරින් යම් පාර්ශ්වකරුවකු විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය. එසේ ඉල්ලා සිටිනු ලැබුවහොත්, නඩු විභාගය අලුතින් ආරම්භ කරනු ලැබිය යුතු ය.

විනිශ්චයකාරවරයා පාර්ශ්වකරුවකු වන අවස්ථාවක, නඩු විභාග කිරීම සඳහා විධිවිධාන.

49. (1) යම් විනිශ්චයකාරවරයකු පාර්ශ්වකරුවකු වන හෝ ඔහු පෞද්ගලික වශයෙන් සම්බන්ධතාවක් දක්වන යම් නඩුවක, අපරාධ නඩුවක, නඩු කටයුත්තක හෝ කාරණයක පාර්ශ්වකරුවන් දෙදෙනාගේ ම කැමැත්ත ඇතිව මිස, ඒ නඩුව, අපරාධ නඩුව, නඩු කටයුත්ත හෝ කාරණය පිළිබඳව අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමට ඒ විනිශ්චයකාරවරයාට බලය නොතිබිය යුතු අතර, කිසිම අවස්ථාවක එසේ අධිකරණ බලය ක්‍රියාත්මක කරන ලෙස ඒ විනිශ්චයකාරවරයාට බල කිරීම ද කරනු නොලැබිය යුතු ය.

(2) තමා විසින් ම දෙනු ලැබූ යම් නඩු තීන්දුවකට, දණ්ඩන නියමයකට හෝ ආඥාවකට විරුද්ධව කරනු ලබන අභියාචනයක් විභාග කිරීම හෝ ඒ නඩු තීන්දුව, දණ්ඩන නියමය හෝ ආඥාව නැවත සලකා බැලීම හෝ කිසිම විනිශ්චයකාරවරයකු විසින් නො කළ යුතු ය.

(3) එසේ පාර්ශ්වකරුවකු වන හෝ පෞද්ගලික වශයෙන් සම්බන්ධතාවක් දක්වන යම් විනිශ්චයකාරවරයකු ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයකු වන අවස්ථාවක ඔහු පාර්ශ්වකරුවකු වන්නේ හෝ පෞද්ගලික වශයෙන් සම්බන්ධතාවක් දක්වන්නේ යම් නඩුවක්, අපරාධ නඩුවක්, නඩු කටයුත්තක් හෝ කාරණයක් සම්බන්ධයෙන් ද, ඒ නඩුව, අපරාධ නඩුව, නඩු කටයුත්ත හෝ කාරණය නැතහොත් ඒ නඩුවේ දී, අපරාධ නඩුවේ දී, නඩු කටයුත්තේ දී හෝ කාරණයේ දී ඔහු දෙන නඩු තීන්දුවට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි විටක ද, ඒ නඩුව, අපරාධ නඩුව, නඩු කටයුත්ත හෝ කාරණය ඒ අධිකරණයේ වෙනත් යම් විනිශ්චයකාරවරයකු විසින් හෝ විනිශ්චයකාරවරයන් විසින් හෝ විභාග කිරීම හෝ තීරණය කිරීම කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, වෙනත් සෑම අවස්ථාවක දී ම, අවස්ථාවෝචිත පරිදි, යාබද කලාපයෙහි, දිසාවෙහි හෝ කොට්ඨාසයෙහි, මහාධිකරණයේ, දිසා අධිකරණයේ, පවුල් අධිකරණයේ, මහේස්ත්‍රාත් අධිකරණයේ හෝ ප්‍රාථමික අධිකරණයේ යම් විනිශ්චයකාරවරයකුට ඒ නඩුව, අපරාධ නඩුව, නඩු කටයුත්ත හෝ කාරණය විභාග කිරීමට, නඩු විභාග කිරීමට හා තීරණය කිරීමට අධිකරණ බලය තිබිය යුතු ය.

**50.** අපරාධයක් හෝ වරදක් සිදු කරන ලදැයි කියනු ලැබීම නැතහොත් යම් අපරාධයක් හෝ වරදක් හෝ සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු කරනු ලැබීම හෝ නිදොස් කරනු ලැබීම, එවැනි යම් අපරාධයක් හෝ වරදක් හෝ සිදු කිරීමේ හේතුවෙන් යම් හානියක් සිදු වී ඇති හෝ තමාට යම් හානියක්, පාඩුවක් හෝ අලාභයක් සිදු වූයේ යයි කියන්නා වූ යම් තැනැත්තකුගේ ඉල්ලීම පිට, මුලින් කී තැනැත්තාට විරුද්ධව අලාභ ඉල්ලා සිවිල් නඩුවක් පවරනු ලැබීමට බාධාවක් නොවිය යුතු ය.

වරදකරු කිරීම හෝ නිදොස් කිරීම යම් සිවිල් නඩුවකට බාධාවක් නොවිය යුතු බව.

**51.** යම් අපරාධයක් හෝ වරදක්, ඒ සම්බන්ධයෙන් වරදකරු කිරීමේ ආඥාවක් කරන අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි දඬුවමකින් හෝ ඒ අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි දඩයකින් නැතහොත් බන්ධනාගාරගත කිරීමකින් හෝ දඬුවම් කරනු ලැබිය හැකි අපරාධයක් නැතහොත් වරදක් ලෙස යම් ලිඛිත නීතියක් මගින් ප්‍රකාශයට පත් කර ඇති අවස්ථාවක, ඒ අපරාධය හෝ වරද සම්බන්ධයෙන් නඩු පැවරීමේ කාර්යය සඳහා නීතිපතිවරයා විසින් තෝරාගනු ලබන්නා වූ, අපරාධ අධිකරණ බලය ඇත්තා වූ ද, අපරාධය හෝ වරද සිදු කරන ලද්දේ අවස්ථාවෝචිත පරිදි යම් කලාපයක්, දිසාවක් හෝ කොට්ඨාසයක් තුළ ද ඒ කලාපයේ, දිසාවේ හෝ කොට්ඨාසයේ විය යුතු වූ ද යම් අධිකරණයක දී ඒ අපරාධය හෝ වරද සම්බන්ධයෙන් නඩු විභාගය පවත්වනු ලැබිය හැකි ය. ඒ කාර්යය සඳහා අධිකරණ බලය ඒ අධිකරණ

දඩයකින් හෝ බන්ධනාගාරගත කිරීමකින් හෝ දඬුවම් කළ හැකි යයි ප්‍රකාශිත වැරදි සාමාන්‍යයෙන් විභාග කළ හැක්කේ කවර අධිකරණයක දී ද යන වග.

යට මෙයින් දෙනු ලැබේ. එසේ වුව ද, වූදිත තැනැත්තා වරදකරු කරනු ලැබූ විටක, ඔහුගේ නඩුව විභාග කළ අධිකරණයට ස්වකීය සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී බලය පැවරී ඇත්තේ යම් දඩයක් නියම කිරීමට ද, ඊට වැඩි ප්‍රමාණයක දඩයක් හෝ බලය පැවරී ඇත්තේ යම් කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමක් නියම කිරීමට ද ඊට වැඩි කාලයක් බන්ධනාගාරගත කිරීමක් හෝ ඒ වූදිත තැනැත්තාට නියම කරනු නොලැබිය යුතු ය. නියම කර ඇති උපරිම දඬුවම, මහේස්ත්‍රාත් අධිකරණයක් හෝ ප්‍රාථමික අධිකරණයක් හෝ විසින් නියම කිරීමට බලය පවරා ඇති උපරිම දඬුවම ඉක්මවන අවස්ථාවක දී වුව ද, අධිකරණය තෝරා ගැනීමේ අභිනිවාසිකම නීතිපතිවරයා විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

මූල් අවස්ථා අධිකරණවල රෙජිස්ට්‍රාර්වරයා සහ වෙනත් නිලධරයෝ.

52. (1) මේ පනත යටතේ පිහිටුවන ලද මහාධිකරණයට සහ එක් එක් දිසා අධිකරණයට, පවුල් අධිකරණයට, මහේස්ත්‍රාත් අධිකරණයට සහ ප්‍රාථමික අධිකරණයට, රෙජිස්ට්‍රාර්වරයකු, පිස්කල්වරයකු සහ ඒ අධිකරණවල අධිකරණ නියෝග භාර දීම හා තීන්දු ප්‍රකාශ ක්‍රියාවේ යෙදවීම සහ යම් ලිඛිත නීතියක් යටතේ ක්‍රියාත්මක කළ හැකි වෙනත් ආඥා ක්‍රියාත්මක කිරීම ද ඇතුළුව ඒ අධිකරණවල පරිපාලනය සඳහා සහ බලතල යථා පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා සහ කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වෙනත් නිලධරයන් පත් කරනු ලැබිය යුතු ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා, අභියාචනාධිකරණයේ සභාපතිවරයාගේ අධීක්ෂණයට, විධානයට සහ පාලනයට යටත්ව ක්‍රියා කළ යුතු ය.

නිලධරයන් නොමැති විට විධායක කටයුතු කිරීම.

53. යම් අධිකරණයක අධිකරණ නියෝගයක් හෝ සහතිකයක් හෝ වෙනත් ලේඛනයක් අත්සන් කිරීමට නැතහොත් යම් සාධන පත්‍රයක් ලියා අත්සන් කිරීමට නැතහොත් වෙනත් යම් නිශ්චිත කාර්යයක් හෝ කර්තව්‍යයක් ඉටු කිරීමට නීතියෙන් බලය දී ඇති හෝ නියම කර ඇති, ඒ අධිකරණයේ යම් විධායක නිලධරයකු හෝ වෙනත් නිලධරයකු හෝ සේවයට පැමිණ නොමැති විටක ඒ අධිකරණ නියෝගය, සහතිකය හෝ ලේඛනය අත්සන් කිරීමට හෝ ඒ සාධන පත්‍රය ලියා අත්සන් කිරීමට හෝ ඒ කාර්යය හෝ කර්තව්‍යය ඉටු කිරීමට ඒ අධිකරණයේ වෙනත් යම් නිලධරයකුට විධාන කිරීමේ බලය ඒ අධිකරණයේ විනිශ්චයකාරවරයාට තිබිය යුතු ය. විනිශ්චයකාරවරයාගේ එවැනි යම් විධානයකට අනුකූලව ඒ නිලධරයා විසින් ඒ සම්බන්ධයෙන් කරන ලද සෑම ක්‍රියාවක් ම සියලු කාර්ය සඳහා වලංගු හා බලසහිත ලෙස සලකනු ලැබිය යුතු ය.

ඉන්ජන්ක්ෂන් තහනම.

54. (1) මහාධිකරණයක, දිසා අධිකරණයක හෝ පවුල් අධිකරණයක පවරන ලද යම් නඩුවක දී—

(අ) යම් ක්‍රියාවක් හෝ පීඩාවක් සිදු කිරීම නැතහොත් දිගටම කරගෙන යාම නිසා පැමිණිලිකරුට හානියක් සිදු විය හැකි වීමට හේතු කොට ගෙන ඒ ක්‍රියාව හෝ පීඩාව සිදු කිරීම නැතහොත් දිගටම කර ගෙන යාම තහනම් කෙරෙන නඩු තීන්දුවක් විත්තිකරුට විරුද්ධව දෙන ලෙස පැමිණිලිකරු ඉල්ලා සිටින බවත් ඔහුට ඒ නඩු තීන්දුව ලබා ගැනීමට හිමිකම ඇති බවත් පැමිණිල්ලෙන් පෙනී යන; හෝ

(ආ) ඒ නඩුවේ විෂය කාරණය සම්බන්ධයෙන් පැමිණිලිකරුට ඇති අයිතිවාසිකම් කඩ කරමින් හා නඩු තීන්දුව නිරර්ථක බවට පත් කිරීමට තුඩු දෙන ආකාරයේ යම් ක්‍රියාවක් හෝ පීඩාවක් ඒ නඩුව විනිශ්චයට භාජන වී තිබෙන අතර තුර දී, විත්තිකරු විසින් කරනු ලබන බව හෝ සිදු කරනු ලබන බව හෝ කිරීමට නැතහොත් සිදු කිරීමට සලසනු ලබන බව හෝ ඉඩ දෙනු ලබන බව හෝ කිරීමට හෝ කරනු ලැබීමට හෝ සිදු කරනු ලැබීමට සලසනු ලබන බවට හෝ ඉඩ දෙනු ලබන බවට තර්ජනය කරන බව හෝ ආසන්න බව පෙනී යන ; හෝ

(ඇ) ඒ නඩුව විනිශ්චයට භාජන වී තිබෙන අතරතුර, පැමිණිලි කරුට වංචා කිරීමේ චේතනාවෙන්, විත්තිකරු විසින් ඔහුගේ දේපළ ඉවත් කරන බවට නැතහොත් බැහැර කරන බවට තර්ජනය කරනු ලබන බව හෝ එසේ ඉවත් කිරීමට නැතහොත් බැහැර කිරීමට ආසන්න බව පෙනී යන

අවස්ථාවක, ඉන්ජන්ක්ෂන් තහනමක් නිකුත් කිරීමට තරම් ප්‍රමාණවත් හේතු ඇති බව පැමිණිලිකරුගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ දිවුරුම් පත්‍රයෙන් අධිකරණයට පෙනී ගියහොත්—

(i) ඒ ක්‍රියාව හෝ පීඩාව සිදු කිරීම හෝ දිගටම සිදු කිරීම ;

(ii) ඒ ක්‍රියාව හෝ පීඩාව කිරීම හෝ සිදු කිරීම ;

(iii) ඒ දේපළ ඉවත් කිරීම හෝ බැහැර කිරීම

එකී විත්තිකරුට තහනම් කරමින් ඒ අධිකරණය විසින් ඉන්ජන්ක්ෂන් තහනමක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) තම උත්තරයෙන් යම් හරස් ඉල්ලීමක් ඉදිරිපත් කරන සහ පැමිණිලිකරුට විරුද්ධව අස්ථාවර්ථ නඩු තීන්දුවක් ඉන් ඉල්ලා සිටින යම් විත්තිකරුවකු මේ වගන්තියේ කාර්ය සඳහා පැමිණිලි කරුවකු ලෙස සලකනු ලැබිය යුතු අතර, තම හරස් ඉල්ලීමෙහි සඳහන් කර ඇති නඩු නිමිත්ත මත විත්තිකරු විසින් පැමිණිලිකරුට විරුද්ධව පවරනු ලබන නඩුවක දී, ඉන්ජන්ක්ෂන් තහනමක් සඳහා ඔහුට තිබිය හැකි අයිතිවාසිකම ම ඔහුට තිබිය යුතු ය. තව ද එවිට පැමිණිලිකරු විත්තිකරු වශයෙන් ද හරස් ඉල්ලීම පැමිණිල්ල වශයෙන් ද සලකනු ලැබිය යුතු ය.

(3) එවැනි ඉන්ජන්ක්ෂන් තහනමක්, සිතාසි සමග ම හෝ නඩුව ආරම්භවීමෙන් පසු සහ අවසාන නඩු තීන්දුව දීමට පෙර කවර වූ හෝ අවස්ථාවක හා අධිකරණයේ අභිමතය පරිදි දැන්වීමක් සහිතව හෝ රහිතව නිකුත් කරනු ලැබිය හැකි ය. විත්තිකරු පෙනී සිටි අවස්ථාවක දී ඉන්ජන්ක්ෂන් තහනමක් නිකුත් කළ යුත්තේ, දැන්වීමක් කිරීමෙන් පසු හෝ හේතු දක්වන ලෙස ආඥාවක් කිරීමෙන් පසු හෝ පමණකි. විත්තිකරු පෙනී සිටි පසු නැතහොත් ඊට පෙර, දැන්වීමක් කිරීමෙන් පසු හෝ හේතු දක්වන ලෙස ආඥාවක් කිරීමෙන් පසු හෝ ඉන්ජන්ක්ෂන් තහනමක් සඳහා ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, ඒ ඉල්ලීම විභාග කොට, තීරණයක් දෙනු ලබන තුරු, විත්තිකරු හෝ වෙනත් යම් තැනැත්තකු හෝ වළක්වමින් අධිකරණය විසින් ඉන්ජන්ක්ෂන් තහනමක් නිකුත් කරනු ලැබිය හැකි ය.

අධිකරණයට අපහාස කිරීම පිළිබඳ නඩු කටයුතු.

**55.** (1) සෑම දිසා අධිකරණයක් ම, පවුල් අධිකරණයක් ම, මහේස්ත්‍රාත් අධිකරණයක් ම සහ ප්‍රාථමික අධිකරණයක් ම ඉදිරියේ සිදු කරනු ලබන අධිකරණයට අපහාස කිරීමේ සෑම වරදක් ම සහ පිළිවෙළින් ඒ ඒ අධිකරණවල දී කරනු ලබන යම් ක්‍රියාවක දී නැතහොත් පවත්වා ගෙන යනු ලබන නඩු කටයුත්තක දී කරනු ලබන්නා වූ ද අධිකරණයට අපහාස කිරීමක් වශයෙන් දඬුවම් කළ යුතු යයි තත් කාලයෙහි වලංගුව බලපවත්නා යම් නීතියකින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත්තා වූ ද සියලු වැරදි ඒ අධිකරණයේ නිසි අධිකාරය සහ කාර්යක්ෂමතාව පවත්වා ගෙන යාමේ කාර්යය සඳහා සංජානනය කිරීමට සහ ඒ වැරදි සඳහා මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි වූ දණ්ඩනවලින් ඒ වැරදි සම්බන්ධයෙන් දඬුවම් කිරීමට විශේෂ අධිකරණ බලය ඒ ඒ වැරදි සඳහා අධිකරණවලට තිබිය යුතු ය.

(2) අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ විට, අවස්ථාවෝචිත පරිදි, පහත දැක්වෙන දඩ පිළිබඳ හෝ බන්ධනාගාරගත කිරීම් පිළිබඳ දණ්ඩන නියමයන් පිළිවෙළින් පහත දැක්වෙන අධිකරණ විසින් නියම කරනු ලැබිය හැකි ය.

එනම්—

(අ) දිසා අධිකරණයක් සහ පවුල් අධිකරණයක් විසින්, රුපියල් දෙදහස් පන්සියයක් නොඉක්මවන දඩයක් හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් බරපතල වැඩ ඇතිව හෝ නැතිව හෝ බන්ධනාගාරගත කිරීම ;

(ආ) මහේස්ත්‍රාත් අධිකරණයක් විසින්, රුපියල් එක් දහස් පන්සියයක් නොඉක්මවන දඩයක් හෝ මාස දහඅටක් නොඉක්මවන කාලයක් බරපතල වැඩ ඇතිව හෝ නැතිව හෝ බන්ධනාගාරගත කිරීම ;

(ඇ) ප්‍රාථමික අධිකරණයක් විසින්, රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයක් හෝ මාස තුනක් නොඉක්මවන කාලයක් බරපතල වැඩ ඇතිව හෝ නැතිව හෝ බන්ධනාගාරගත කිරීම.

අන්තර්කාලීන විධිවිධාන.

**56.** (1) දිසා අධිකරණවල සහ මහේස්ත්‍රාත් අධිකරණවල මේ වගන්තියෙහි විධිවිධාන ක්‍රියාත්මක කරනු ලබන දිනයට ඉහතින් ම වූ දිනයෙහි, මේ පනත මගින් දිසා අධිකරණයක, පවුල් අධිකරණයක හෝ ප්‍රාථමික අධිකරණයක අධිකරණ බලය ඇතුළත වූ කාරණා සම්බන්ධයෙන් විනිශ්චයට භාජනව පැවති සියලු සිවිල් නඩු, නඩු කටයුතු හෝ කාරණා, අවස්ථාවෝචිත පරිදි, උචිත දිසා අධිකරණයට, පවුල් අධිකරණයට හෝ ප්‍රාථමික අධිකරණයට භාර වන්නේ ය. තව ද ඒ සියලු සිවිල් නඩු, නඩු කටයුතු හෝ කාරණා සංජානනය කිරීමට, විභාග කිරීමට හා තීරණය කිරීමට හෝ දිගටම පවත්වා ගෙන යාමට හා නිම කිරීමට ඒ අධිකරණයට අධිකරණ බලය තිබිය යුතු අතර, මුලින් කී දිසා අධිකරණය සහ මහේස්ත්‍රාත් අධිකරණය විසින් මේ වගන්තියෙහි විධිවිධාන ක්‍රියාත්මක කරනු ලබන දිනයට පෙර ප්‍රකාශ කරන ලද

හෝ කරන ලද නඩු තීන්දු සහ ආඥා, අවස්ථාවෝචිත පරිදි, උචිත දිසා අධිකරණය, පවුල් අධිකරණය හෝ ප්‍රාථමික අධිකරණය විසින් ප්‍රකාශ කරන ලද්දක් හෝ කරන ලද්දක් මෙන් වලංගු හා බලාත්මක විය යුතු ය :

එසේ වුව ද, මේ වගන්තියෙහි විධිවිධාන ක්‍රියාත්මක කරනු ලබන දිනයට ඉහතින් ම වූ දිනය වන විට, එවැනි යම් සිවිල් නඩුවක, නඩු කටයුත්තක හෝ කාරණයක සාක්ෂි මෙහෙයවීම අවස්ථාවෝචිත පරිදි, දිසා අධිකරණයේ දී හෝ මහේස්ත්‍රාත් අධිකරණයේ දී ආරම්භ කර තිබුණේ නම්, ඒ සිවිල් නඩුව, නඩු කටයුත්ත හෝ කාරණය එකී දිසා අධිකරණය විසින් හෝ මහේස්ත්‍රාත් අධිකරණය විසින් හෝ විභාග කොට, තීරණය කළ යුතු ය.

(2) යම් දිසා අධිකරණයක මේ වගන්තියෙහි විධිවිධාන ක්‍රියාත්මක කරනු ලබන දිනයට ඉහතින් ම වූ දිනයෙහි, විනිශ්චයට භාජනව පැවති සියලු අපරාධ නඩු, නඩු කටයුතු හෝ කාරණා මහාධිකරණයට භාර වන්නේ ය. තව ද, ඒ සියලු අපරාධ නඩු සංජානනය කිරීමට, විභාග කිරීමට සහ තීරණය කිරීමට හෝ දිගටම පවත්වා ගෙන යාමට හා නිම කිරීමට ඒ අධිකරණයට අධිකරණ බලය තිබිය යුතු අතර, ඉහත කී දිසා අධිකරණය විසින්, මේ වගන්තියෙහි විධිවිධාන ක්‍රියාත්මක කරනු ලබන දිනයට පෙර ප්‍රකාශ කරන ලද හෝ කරන ලද නඩු තීන්දු සහ ආඥා, මහාධිකරණය විසින් ප්‍රකාශ කරන ලද්දක් හෝ කරන ලද්දක් මෙන් වලංගු හා බලාත්මක විය යුතු ය :

එසේ වුව ද, මේ වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක කරනු ලබන දිනයට ඉහතින් ම වූ දිනය වන විට, ඒ දිසා අධිකරණයේ දී යම් අපරාධ නඩුවක, නඩු කටයුත්තක හෝ කාරණයක සාක්ෂි මෙහෙයවීම ආරම්භ කර තිබුණේ නම්, ඒ අපරාධ නඩුව ඒ දිසා අධිකරණය විසින් විභාග කොට තීරණය කළ යුතු ය.

(3) මේ පනතේ විධිවිධාන යටතේ ප්‍රාථමික අධිකරණයක අධිකරණ බලය ඇතුළත වූ මහේස්ත්‍රාත් අධිකරණවල මේ වගන්තියෙහි විධිවිධාන ක්‍රියාත්මක කරනු ලබන දිනයට ඉහතින් ම වූ දිනයෙහි, විනිශ්චයට භාජනව පැවති සියලු අපරාධ නඩු, නඩු කටයුතු හෝ කාරණා, උචිත ප්‍රාථමික අධිකරණයට භාර වන්නේ ය. තව ද, ඒ අපරාධ නඩු, නඩු කටයුතු හෝ කාරණා සංජානනය කිරීමට, විභාග කිරීමට හා තීරණය කිරීමට හෝ දිගටම පවත්වා ගෙන යාමට හා නිම කිරීමට ඒ ප්‍රාථමික අධිකරණයට අධිකරණ බලය ඇති අතර, මුලින් කී මහේස්ත්‍රාත් අධිකරණ විසින් මේ වගන්තියෙහි විධිවිධාන ක්‍රියාත්මක කරනු ලබන දිනයට පෙර ප්‍රකාශ කරන ලද හෝ කරන ලද නඩු තීන්දු සහ ආඥා, උචිත ප්‍රාථමික අධිකරණය විසින් ප්‍රකාශ කරන ලද්දක හෝ කරන ලද්දක් මෙන් වලංගු හා බලාත්මක විය යුතු ය :

එසේ වුව ද, මේ වගන්තියෙහි විධිවිධාන ක්‍රියාත්මක කරනු ලබන දිනයට ඉහතින් ම වූ දිනය වන විට යම් අපරාධ නඩුවක, නඩු කට යුත්තක හෝ කාරණයක සාක්ෂි මෙහෙයවීම ඒ මහේස්ත්‍රාත් අධිකරණයේ දි ආරම්භ කර තිබුණේ නම්, ඒ අපරාධ නඩුව, නඩු කට යුත්ත හෝ කාරණය ඒ මහේස්ත්‍රාත් අධිකරණය විසින් විභාග කොට තීරණය කළ යුතු ය.

ප්‍රාථමික අධිකරණයක විනිශ්චයකාරවරයා පත් කර නොමැති අවස්ථාවක.

**57.** මේ පනත යටතේ පිහිටුවන ලද, යම් අධිකරණ කොට්ඨාසයක ප්‍රාථමික අධිකරණයට විනිශ්චයකාරවරයකු පත් කරනු ලැබ නොමැති අවස්ථාවක, ඒ ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා පත් කරනු ලබන තුරු, ඒ කොට්ඨාසයේ මහේස්ත්‍රාත්වරයා, ඒ කොට්ඨාසයෙහි ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු අතර, ඒ මහේස්ත්‍රාත්වරයා විසින් ඒ ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයාගේ අධිකරණ බලය ක්‍රියාත්මක කළ යුතු ය:

එසේ වුව ද ඒ කොට්ඨාසයේ ප්‍රාථමික අධිකරණයක විනිශ්චයකාරවරයකු පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ කොට්ඨාසයෙහි මහේස්ත්‍රාත්වරයා විසින් සාක්ෂි සටහන් කිරීම ආරම්භ කරනු ලැබ තිබුණු සියලු අපරාධ නඩු, නඩු, නඩු කටයුතු හා කාරණා ඒ මහේස්ත්‍රාත්වරයා විසින් විභාග කොට, තීරණය කරනු ලැබිය හැකි ය.

අධිකරණවල ප්‍රාදේශීය අධිකරණ බල සීමා යහ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම.

**58.** යම් දිසා අධිකරණයක හෝ මහේස්ත්‍රාත් අධිකරණයක ප්‍රාදේශීය අධිකරණ බලසීමාව සංයුක්ත වන කොටසක් වශයෙන් කලින් පැවති යම් ප්‍රදේශයක් මේ පනතේ විධිවිධාන ප්‍රකාර එකී ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළින් බැහැර කර ඇත්තා වූ ද මේ වගන්තියෙහි විධිවිධාන ක්‍රියාත්මක කරනු ලබන දිනයට ඉගතින් ම වූ දිනයේ දී ඒ අධිකරණයේ පැවති යම් නඩුවක්, නඩු කටයුත්තක් හෝ කාරණයක්, ඒ ප්‍රදේශය එසේ බැහැර කිරීම හේතුකොටගෙන ම පමණක් ඒ අධිකරණයේ ප්‍රාදේශීය අධිකරණ බල සීමාවට විෂය වීම නතර වන්නා වූ ද අවස්ථාවක, මේ පනතේ කුමක් සඳහන් වී ඇත ද, ඒ ප්‍රදේශය, අවස්ථාවෝචිත පරිදි, ඒ දිසා අධිකරණයේ හෝ මහේස්ත්‍රාත් අධිකරණයේ ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළින් බැහැර නොකරන ලද විටක මෙන්, ඒ නඩුව, නඩු කටයුත්ත හෝ කාරණය ඒ අධිකරණය විසින් විභාග කොට, තීරණය කිරීම හෝ දිගටම පවත්වා ගෙන ගොස් නිම කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

අධිකරණය විසින් ඇතැම් කාරණා සම්බන්ධයෙන් උචිත ආඥා කළ යුතු බව.

**59.** මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵලයක් වශයෙන් යම් අධිකරණයක් ඉදිරියේ කාර්ය පටිපාටිය පිළිබඳ යම් කාරණයක් හෝ ප්‍රශ්නයක් පැනනැගුනහොත් හෝ මේ පනතින් විධිවිධාන සලස්වනු ලැබ නොමැති කාර්ය පටිපාටිය පිළිබඳ යම් කාරණයක් හෝ ප්‍රශ්නයක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ කාරණයක් හෝ ප්‍රශ්නයක් පැනනැගුනහොත් අයුක්තියක් සිදු වීම වැළැක්වීම පිණිස අවශ්‍ය ලෙස අධිකරණය සලකන සහ අවස්ථානුකූලව යුක්තිසහගත වන ආඥා කිරීමට සහ විධාන නිකුත් කිරීමට අධිකරණයට බලය තිබිය යුතු ය.

විශේෂ වර්ගවල නඩු සඳහා අධිකරණ නම් කිරීම.

**60.** අග්‍ර විනිශ්චයකාරවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් නියෝගයක් මගින්, ඒ නියෝගයෙහි සඳහන් වර්ගවල සිවිල් හෝ අපරාධ නඩු කටයුතු හෝ වෙනත් යම් කාරණා විභාග කොට තීරණය කිරීම පිණිස නිශ්චිතව සඳහන් යම් අධිකරණ කලාපයක පවත්වනු ලබන මහාධිකරණය හෝ ශ්‍රී ලංකාවේ ඕනෑම තැනක පිහිටි අධිකරණයක් හෝ අධිකරණ හෝ නම් කරනු ලැබිය හැකි ය. ඒ අනුව, ඒ අධිකරණයේ හෝ අධිකරණවල අධිකරණ බලය පිළිබඳ ප්‍රාදේශීය බල සීමා සම්බන්ධයෙන් මේ පනතෙහි හෝ වෙනත් යම්

ලිඛිත නීතියක පටහැනිව යමක් සඳහන්ව ඇත ද, ඒ අධිකරණයට හෝ අධිකරණවලට ඒ සියලු නඩු කටයුතු හෝ කාරණා විභාග කොට තීරණය කිරීම සඳහා අධිකරණ බලය තිබිය යුතු ය:

එසේ වුව ද, එවැනි යම් අධිකරණයක් හෝ අධිකරණ නාම කිරීම එවැනි යම් නඩු කටයුතු හෝ කාරණා විභාග කොට තීරණය කිරීමට වෙනත් යම් අධිකරණයකට ඇති අධිකරණ බලය කෙරෙහි බල නොපෑ යුතු ය:

එසේ ම තවදුරටත්, මේ වගන්තිය යටතේ නියෝග සාදනු ලබන තුරු, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ 46 වන වගන්තිය යටතේ සාදනු ලැබ, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙහි බලාත්මකව පවතින සියලු නියෝග අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

**61.** (1) මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලගැන්වීමේ කාර්යය සඳහා ද නියම කළ යුතු ලෙසට මේ පනතින් නියම කොට ඇති හෝ නියෝග සෑදීමට මේ පනතින් බලය දී ඇති හෝ කාරණා සම්බන්ධයෙන් ද අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයෙහි සිට හෝ නියෝගයෙහි සඳහන් කරනු ලබන යම් පසු දිනයක සිට හෝ එය බලාත්මක විය යුතු ය.

(3) සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබ මෙන් පසු, හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොවන පරිදි එම අනනුමතයේ දිනයෙහි සිට, පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුත්තේ යම් දිනයක සිට ද, ඒ දිනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

**62.** ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ I වන පරිච්ඡේදය සහ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනත මෙයින් ඉවත් කරනු ලැබේ. ඉවත් කිරීම.

අර්ථ නිරූපණය.

63. මේ පනතෙහි—

" ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණය " යන්නෙන්, මේ පනත පන වනු ලබන දිනයෙහි පැවතියා වූ ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 169 (6) වන ව්‍යවස්ථාව සමග කියවිය යුතු 105 (2) වන ව්‍යවස්ථාව ප්‍රකාර පාර්ලිමේන්තුව විසින් පිහිටුවා ඇති කරන ලදැයි සලකනු ලබන්නා වූ ද මහාධිකරණය අදහස් වේ ;

" දිසා අධිකරණ " සහ " මහෙස්ත්‍රාත් අධිකරණ " යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105 (2) වන ව්‍යවස්ථාව ප්‍රකාර පාර්ලිමේන්තුව විසින් පිහිටුවා ඇති කරන ලදැයි සැලකෙන දිසා අධිකරණ සහ මහෙස්ත්‍රාත් අධිකරණ අදහස් වේ.

## පළමුවන උපලේඛනය

[6(2) වන වගන්තිය]

### ධුරයේ ප්‍රතිඥාව හෝ දිවුරුම

1978 අධිකරණ සංවිධාන පනතේ 6(2) වන වගන්තිය

........................................................................වන මම ශ්‍රී ලංකා ජනරජයට අවනත වන බවට ද, පක්ෂපාත වන බවට ද, ශ්‍රී ලංකා ජනරජයට හිතැතිව සහ අවංකව, සේවය කරන බවට ද,........................................................වශයෙන් මගේ ධුරයට අයත් කාර්යයන් යථා පරිදි සහ අවංකව යහ මගේ පූර්ණ හැකියාව, දැනුම හා විනිශ්චය අනුවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හා නීතියට අනුකූලවත් ඉටු කරන බවට ද, ශ්‍රී ලංකා ජනරජයේ නීති හා ව්‍යවහාර අනුව ද භයක්, පක්ෂපාතයක්, දයාවක් හෝ ද්වේෂයක් නොමැතිව ද සැම සියලු දෙනාට ම සාධාරණයත්, යුක්තියත් ඉටු කරන බවට ද ගෞරව බහුමානයෙන් යුක්තව ප්‍රතිඥා දෙමි./දිවුරුම් දෙමි.

19........................මස........වන දින, ..................

..............................දී ය.

මා ඉදිරිපිට දී,

..........................

සමාදාන විනිශ්චයකාරවරයා.

## දෙවන උපලේඛනය

[11 (1) (අ) වන වගන්තිය]

1. (විශේෂ අධිකරණ මණ්ඩලයක් සඳහා ආඥාවක් කරනු නොලැබූ අවස්ථාවක) දණ්ඩ නීති සංග්‍රහයේ VI වන පරිච්ඡේදයේ විධිවිධාන යටතේ දඬුවම් කරනු ලැබිය හැකි සියලු වැරදි.
2. දණ්ඩ නීති සංග්‍රහයේ 296 වන, 297 වන, 300 වන සහ 364 වන වගන්ති යටතේ දඬුවම් කරනු ලැබිය හැකි වැරදි.
3. 1966 අංක 18 දරන පිඩාකාරි ආයුධ පනතේ 4 (2) වන වගන්තිය යටතේ සහ 6 (1) වන වගන්තිය සමග කියවිය යුතු 4 (2) වන වගන්තිය යටතේ දඬුවම් කරනු ලැබිය හැකි වැරදි.
4. ඉහත අංක 1 සහ 2 යටතේ විස්තර කර ඇති වැරදි කිරීමට අනුබල දීම හෝ ඒ වැරදි කිරීම සඳහා හෝ ඒ වැරදි කිරීමට අනුබල දීම සඳහා කුමන්ත්‍රණය කිරීම සහ ඉහත අංක 3 යටතේ විස්තර කර ඇති වැරදි කිරීම සඳහා කුමන්ත්‍රණය කිරීම.

## තුන්වන උපලේඛනය

[24 (2) වන වගන්තිය]

(61 වන අධිකාරය වූ) ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥාපනත.

(110 වන අධිකාරය වූ) උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනත.

(101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය.

(116 වන අධිකාරය වූ) විදේශීය විවාහ ආඥාපනත.

1970 අංක 3 දරන සුජාත කිරීමේ පනත.

(91 වන අධිකාරය වූ) නඩත්තු ආඥාපනත.

(112 වන අධිකාරය වූ) විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත.

(57 වන අධිකාරය වූ) වෛවාහික අයිතිවාසිකම් හා උරුම ආඥාපනත.